# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයේ /57 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව

### 2022-11-10

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති  ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
11. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
13. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
14. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
15. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
16. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
17. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
18. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
19. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
20. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
21. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
22. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
24. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
25. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
26. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය
27. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
28. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය

29. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
30. ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
31. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුභසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2022-10-13 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

තීරණ අංක 01

2022-10-13 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

❖ ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මහා සභාවේදී ජයවීදි මාවතේ සෞභාග්‍යයේ මංපෙත් වැඩ සටහන යටතේ කොන්ක්‍රීට් දැමූ පෞද්ගලික මාර්ගයේ හිමිකරු ඉල්ලීම් ලිපියක් දුන් බවට පැවසූ බවත්, එම ලිපිය සභාගත කරන ලෙසට තමන් ඉල්ලීමක් කල බවත් නමුත් එය සභාගත කර නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාට හිමිකරුගේ ඉල්ලීම් ලිපියක් දුන් බවට පැවසූ බවත්.මෙය සොයා බලා පවසන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාසයක් ගත වී ඇති බවත්,එය ලබා දීමට කටයුතු කරන ලෙසට ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න යටතේ පසුගිය මහා සභාවේදී කණු අංකණය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කල ප්‍රශ්න වලට ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දුන් බවත්, එහි කණු 16720 ක් ලෙස පැවසූ බවත්, එම සේවක මහතාව දෛනික පදනම යටතේද,කොන්ත්‍රාත් පදනම යටතේද නැතිනම් නිත්‍ය සේවකයෙකුද යන්නත් දැන ගැනීමට අවශ්‍ය බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.
ප්‍රශ්නය ඉදිරිපත් කල ආකාරයට පිළිතුරු ලබා දුන් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එම සේවක මහතා කොන්ත්‍රාත් පදනම යටතේ වැඩ කටයුතු කරන බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.
කණු වලට තීන්ත ලීටර් 20ක් රු.7250.00ක් ලෙස සඳහන් වන බවත්,මීට වසර දෙකකට පෙර මිල ගණන් තමා සතුව තිබෙන බවත්,මේ සඳහා යොදා ගෙන තිබෙනුයේ Road marking black තීන්ත වර්ගය නොවන බවත්,තමන්ද වසර 23ක සිට මෙම වෘත්තියේ නියැලෙන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. මෙය සාවද්‍ය තොරතුරක් බවත්, මීට වසර දෙකකට පෙර මෙම තීන්ත වර්ගයේ ලීටර් 4ක් රු.3500.00ක් බවත් මෙහිදී ලීටර් 20ම රු.7250.00ක් බව ඉදිරිපත් කර තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.අප කණු 200ක් එක් ලීටරයකින් අංකණය කරන බවට උපකල්පනය කලහොත් ලීටර් 83ක් යන බවත් සම්පූර්ණයෙන්ම සාවද්‍ය තොරතුරු මහා සභාවට ඉදිරිපත් කර තිබෙන බවත් මෙලෙස තොරතුරු ඉදිරිපත් නොකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදාල කටයුතු සිදු කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කල අතර නමුත් එය සිදු කර තිබෙනුයේ Road marking black තීන්ත වර්ගයෙන් නොවන බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.
මෙහිදී ප්‍රශ්නය තිබෙනුයේ මේ වන විට බොහෝ කණුවල අංක මැකීගෙන යාම බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

කණුවල අංක මැකෙන කාරණය ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා දන්නා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව දැවැන්ත වැඩ කොටසක් කරන මෙවැනි ප්‍රාදේශීය සභාවක රටේ මහා විශාල අද්විතීය නමක් තිබෙන ප්‍රාදේශීය සභාවක කණුවේ අංක ලියූ තීන්ත වර්ගය පිළිබඳව කතා කිරීම සම්බන්ධයෙන් තමන් ලැජ්ජා වන බව ප්‍රකාශ කරන ලදී. තමන් මෙහිදී යෝජනා කලේ මෙම කණු ප්‍රමාණය ඉක්මනින් අංක කර පසුව හලාවත නගර සභා බල ප්‍රදේශ තුල සිදු කල ආකාරයට ටැග් එකක් සකස් කර එල්ලීම පිළිබඳවද ලේකම්තුමා සමග කතා කල බවත්, නමුත් ඒ සඳහා කල් මදි වූ බවත් මෙම සේවකයාව වෙනත් ස්ථානයකට යෙදවීම මත එම කටයුත්ත අවසන් කිරීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. කනුවේ අංකය මැකී එය සොයා ගැනීමට අවශ්‍ය නම් ඊට යාබද කණුවේ අංකය මත එය තීරණය කල හැකි බවත්,තමන්ට දුරකථනයෙන් කතා කරන සියළු දෙනාටම තමන් එය පැහැදිලි කර දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

සෝෂාව......

යම් අංක මරණ දැන්වීම්, පෝස්ටර් ඇලවීම මත මැකී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

Road marking තීන්ත වර්ගය ගැලවී නොයන බවත්,එය වසර 5ක් පමණ තබා ගත හැකි බවත්,මෙහිදී භාවිතා කර තිබෙනුයේ එම තීන්ත වර්ගය නොවන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී තමන් තීන්ත වර්ගය පිළිබඳ නොදන්නා බවත්,මේ පිළිබඳව වැඩ අධිකාරී මහතාගෙන් වාර්තාවක් ගෙන ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බොරු තොරතුරු ලබා නොදෙන ලෙස ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

බොරු තොරතුරු ලබානොදෙන බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම තීන්ත මිල දී ගන්නේ කවුරුන්දැයි ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එය ගබඩාවෙන් මිල දී ගත් බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් ඉදිරිපත් කරන ලදී.

තීන්ත වර්ගය පිළිබඳව අදාල නිලධාරින් මෙම තොරතුරු ඉදිරිපත් කර ඇති බවත්,මේ පිළිබඳව නැවත වාර්තාවක් ගෙන ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමන් මෙහිදී සියළු දෙනාගේම අවධානය යොමු කල බවත්,වැඩ අධිකාරී මහතාගෙන්ම විමසීම නොවන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

වැඩ අධිකාරී මහතාගේ වාර්තාව පදනම් කරගෙන කතා කල යුතු බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගැටළුවක් මතු වූ බවත්, මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීනි එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ප්‍රකාශ කරන ලදී.

එය ලබා දී තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම වාර්තාවේ තුන්වන පිටුවේ ප්‍රාදේශීය සභාවට අයත් දංකොටුව වෙළඳ සංකීර්ණයේ පළමු අධියරයේ කඩ කාමර පද්ධතියට අවහිරයක්ව පවතින ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ගෙන ඊළඟ කර්මාන්ත කමිටුවට එම වාර්තාව යොමු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර තිබෙන බවත්,කමිටු දෙකක් තිබූ බවත් නමුත් ඒ සඳහා ඉදිරිපත් නොවූ බවද ප්‍රකාශ කරන ලදී.

තමන් වැඩ අධිකාරීමහතාට මේ පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාස දෙකක් ගත වී ඇති බවත් ,පසුවිපරමක් කර පිළිතුරක් ඉදිරිපත් කල යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ඊළඟ කර්මාන්ත කමිටුවට අදාල නිලධාරී සමඟ එය යොමු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සම්මත කිරීමේදී එහි සඳහන් කරුණු සත්‍යද අසත්‍යද යන්න පිළිබඳ කතා කිරීමට මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් තිබෙන බවත්, ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා පවසන දේ සත්‍ය බවත් ප්‍රකාශ කරන ලදී. අඩුපාඩු තිබෙන බවත් ඒවා නිවැරදි කර ගත යුතු බවත් එතුමා ඉදිරිපත් කල ප්‍රශ්නයට ලැබී තිබෙන පිළිතුර සම්බන්ධයෙන් එතුමා කතා කල බවත් එතුමාට ඒ පිළිබඳව තේරුමක් තිබෙන බැවින් එතුමා ප්‍රශ්නය ඉදිරිපත් කල බවත් එම අදාල වැඩ අධිකාරී මහතාගේ වාර්තාව සභාගත කරන ලෙසට තමන් ගෞරවයෙන් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම දංකොටුව

වෙළඳ සංකීර්ණයේ ගැටළුව නම් සභාවට නොගෙන එන ලෙසත්, ලේකම්මහතාට නිදහසට කාරණා නොපවසන ලෙසත්, මාසයකට එක්කෝටි විසිහතර ලක්ෂයක් වැටුප් ලබා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. ගිය මාසයට පෙර මාසයේ එම වාර්තාව ලබාදෙන ලෙසට සඳහන් වී තිබෙන බවත් තවමත් ලබානොදුන් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මහා සභාවට සියළු දේම ඉදිරිපත් කල යුතු බවත්,මහා සභාව විසින් යෝජනා ස්ථිර කරන්නේ ඒ නිසා බවත් ,මෙය උත්තරීතර ආයතනයක් බවත් ප්‍රකාශ කරන ලදී. ස්ථාන පරීක්ෂාවට සියළු දෙනා ගිය බවත්, ව්‍යවස්ථාපිත ආදායම වැඩි කර ගැනීම පිළිබඳව අයවැයේදී බොහෝ දෙනෙකු කතා කල බවත්, ආදායමක් මේ තුළින් නොලැබෙන බවත්, මාස දෙකක් ගත වී ඇති බවත් මේ පිළිබඳ පිළිතුරු සපයන ලෙසට අදාල නිලධාරීන් හෝ කැඳවන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මෙය කැඩීමට පැවසුවද කී මනී ක්‍රමය යටතේ මිල දී ගත් පුද්ගලයා එය කැඩීමට එකඟ විය යුතු බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එම කාරණා සියල්ලම සත්‍ය බවත්,වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස මෙහිදී පවසන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

අදාල කඩ හිමියන් සියළු දෙනාවම ගෙන්වා සාකච්ඡා කර තීන්දුව ගන්නා ලෙස ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. කර්මාන්ත කමිටුවට කඩ කැඩීමට තීරණයක් ගත නොහැකි බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

කර්මාන්ත කමිටුව කඩ කැඩීමට තීරණ ගෙන නොමැති බව ගරු මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

භාවිතා කල කඩ කාමර සහ භාවිතා නොකල කඩ සමූහයක් තිබෙන බවත්, එම කඩහිමියන්ව ගෙන්වා සාකච්ඡා කිරීමේදී එක් පිරිසක් ඉදිරිපස කඩ කාමර කඩා දුන හොත් පිටුපස කඩකාමර විවෘත කල හැකි බව පවසන බවත්,තවත් පිරිසක් විසින් ඉදිරිපස ශක්තිමත් බැවින් එම කඩ කාමර නොකඩන ලෙසට පවසන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙම ගැටළුව නිරාකරණය කර ගෙන මෙම කඩකාමර විවෘත කිරීමට එදාකල සිටම තමන් වෙහෙස වූ බවත් නමුත් තවමත් මෙම ගැටළුව නිරාකරණය කර ගැනීමට තමන්ට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී.දැන් වුවද ඉදිරිපස කොටස කඩා ඉතිරි කොටස ලබා දීමට සූදානම් බවත්,නමුත් ඒ සඳහා අදාල නිලධාරීන් පැමිණ වාර්තාවක් ලබා දිය යුතු බවත්,මෙම තිබෙන වැඩ කොටසත් සමඟ අතපසුවීම් සිදු වන බවත්,වැඩ අධිකාරී මහතා දින ගණනාවක් කුරුණෑගල යන බවත්,පාරවල් සෑදීමට ඇස්තමේන්තු සකස් කරන බවත් මාස 7ක් අරගලය නිසා වැඩක් නොකල බවත්, ගිය මාසයේ සිට වැඩ කිරීමට පටන් ගත් බවත් බල ප්‍රදේශයේ මෙම සියළුම වැඩ කිරීමට තාක්ෂණ නිලධාරීන් 3න් දෙනෙකු පමණක් සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළුව කර්මාන්ත කමිටුව පිට නොතබන ලෙසත්,මෙය පොදු පහසුකම් කමිටුවට අයත් කාර්යයක් බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

කර්මාන්ත කමිටුව පිට නොතැබූ බවත්, ඉදි කිරීමක් බැවින් එය කර්මාන්ත කමිටුවට යොමු කර උත්තරයක් ගමුයැයි පැවසූ බවත්, සත්‍ය පැවසූ බවත්, පොදුවේ මේ සඳහා මැදිහත් වී ඊළඟ මාසය වන විට මෙම කඩ කාමර විවෘත කිරීමට සූදානම් කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

### 01.නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

| |
|---|
| තීරණ අංක 02<br><br>මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී. |

- ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
- ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
- ගරු මන්ත්‍රිනී එම්.එම්.මෙරි.වාලට් කුරේ මහත්මිය
- ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
- ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2022සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් මාස වල පැවති පහත සඳහන් කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**2022 ඔක්තෝබර් මස 25 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 4. | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 5. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2022 නොවැම්බර් මස 04 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 4. | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 5. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2022 සැප්තැම්බර් මස 16 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 4. | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 5. | ගරු මන්ත්රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |

**2022 ඔක්තෝබර් මස 07 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 3. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 6. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |

**2022 ඔක්තෝබර් මස 21 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 4. | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 5. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |

**2022 නොවැම්බර් මස 02 වන දින පැවති පරිසර හා සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1 | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| 2 | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| 3 | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| 4 | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| 5 | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 6 | ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා |
| 7 | ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |

**2022 නොවැම්බර් මස 03 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 01 | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 02 | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 03 | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 04 | ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| 05 | ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය |
| 06 | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |

02. සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීමට අදාල ලිපිය සභා ගත කර ඇති බවත්, මේ පිළිබඳ විස්තරයක් කිරීමට ලේකම් මහතාට අවස්ථාව ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳ කොමසාරිස්තුමා විසින් එවා ඇති ලිපිය සියළුම මන්ත්‍රීවරුන්ට එවා තිබෙන බවත්,මේ පිළිබඳව මින් පෙරද සභාවට ඉදිරිපත් කර පසුව සභාව මඟින් කමිටුවට එන නොයන එක තීරණය කල බවත් ,මෙහිදී කොමසාරිස්තුමා විසින් පැහැදිලිවම කාරක සභාවකට සහභාගී නොවුනහොත් දීමනාව හිමි නොවන බවත්,ලිඛිත ඉල්ලීමක් කර හෝ දැනුවත් කර එදින කාරක සභාවට සහභාගී නොවන බව දැනුම් දී අනුමැතියක් ගතයුතු බවත් ප්‍රකාශ කරන ලදී. බොහෝ කාරක සභා වාර්තාවල දැනුම් දී නැත යන්න සඳහන් වන බවත්,එලෙස දැනුම් දී නොතිබුණ හොත් වාර තුනක් යන විට කාරක සභාවෙන් ඉවත් වන බවත් ප්‍රකාශ කරන ලදී. මේ වන විට කොමසාරිස්තුමා නැවත මේ පිළිබඳව දැනුම් දී තිබෙන බවත්, කාරක සභාවට නොපැමිණිමට නොහැකි අවස්ථාවක් වේනම් එය දැනුවත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

නොපැමිණෙන මන්ත්‍රීවරුන්ව මේ මොහොතේම ඉවත් කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම කාරණාව සම්බන්ධයෙන් කතා කල යුතු බවත්, කාරක සභාව පැවැත්වෙන දින වකවාණු පිළිබඳව දින තුනකටවත් පෙර ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කල යුුතු බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. කමිටු වල දින වෙනස් කිරීමේදී අපහසුතාවයට පත් වන බවත් ප්රකාශ කරන ලදී.

Whatsapp අංකය ලබා දෙන ලෙසත්,එවිට දූරකථනයට කෙටි පණිවිඩයක් ලබා දිය හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කර්මාන්ත කමිටුව,පරිසර කමිටුව දිනයටම පැවැත්වෙන බවත්,මුදල් කමිටුව සෑම දාම තිබෙන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

අවශ්‍යතාවය මත එය පැවැත්වීමට සිදු වී තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් නියමිත කමිටු වලට අවහිරයක් නොවී එය පැවැත්විය යුතු බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

අවහිරයක් නොවී එය පැවැත්වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කල අතර කමිටුවේ ලේකම් හරහා දින තුනකට පෙර කමිටුව පිළිබඳ දැනුවත් කරන ලෙස කමිටු ගරු සභාපති වරුන්ටද දැනුම් දෙන ලදී.

කර්මාන්ත කමිටුව නියමිත දිනටම පැවැත්වෙන අතර,අදාල කෙටි පණිවිඩයද දූරකථනයට දැනුම් දෙන බව කර්මාන්ත කමිටුවේ සභාපති ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

කෙටි පණිවිඩයක් පළමුව දින තුනකට පෙර මන්ත්‍රීවරුන්ට යවන ලෙසත් ඉන්පසුව අදාල ලිපි ලේඛණ යවන ලෙසත් ලේකම් මහතාට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

03. 2022-10-18 වන දින පම්බල හරිතවිලා උත්සව ශාලාවේදී වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සියළුම නිලධාරී සේවක මහත්ම මහත්මීන් වෙත "සතුටින් ඉන්නට මනෝ විද්‍යාව'''යන සේවක අභිප්‍රේරණ වැටසටහනක් පැවැත්වීමට හැකි වූ බවත් එය මෙහෙය වූ මනෝවිද්‍යා උපදේශකතුමා ඒ සඳහා සහයෝගය ලබා දුන් ලේකම්මහතා,විෂයභාර නිලධාරී ඇතුළු සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

04. වෙන්නප්පුව වයඹ අභිමානය යන නාමය තුළ කමිටු සභාපතිවරුන් දැක්මත් සමඟ ඉදිරියට ගිය බවත්, මන්ත්‍රීවරුන් අඩුවැඩි වශයෙන් ඒ සඳහා සහයෝගය ලබාදුන් බවත්,ලේකම් මහතා අවශ්‍ය ශක්තිය ලබා දුන් බවත්, වයඹ අභිමානය යන නාමය මුළු පළාත තුලටම ව්‍යාප්ත වී එහි ගෞරවය මෙන්ම ප්‍රණාමය ගිය සතිය තුළ ලබා දීමට හැකි වූ බවත් එය තමන් අභිමානයෙන් යුතුව ප්‍රකාශ කරන බවත් පවසා සිටින ලදී.ජනතාවගේ සුබවිහරණය වෙනුවෙන් සෑම දෙයක්ම සොයා බලා වැඩ කටයුතු කරන සභාවක් බවට අප පත් වී ඇති බවත්, ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වයඹ ගරු ආණ්ඩුකාරතුමා පසුගිය සතියේ ඇල්බට්

ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ පැවති පලාත් ක්‍රීඩා තරඟාවලියට පැමිණි බවත්,එතුමා ක්‍රීඩාංගණය මෙලෙස පවත්වාගෙන යාම අගය කල බවත් ප්‍රකාශ කරන ලදී.තමන් විසින් භාවිතා කරන වයඹ අභිමානය යන නාමය ඇත්තෙන්ම අප සභාවට දීමට වටිනා බව එතුමාගේ කටින්ම පැවසූ බවත් එය ඇත්තෙන්ම ඉමහත් සතුටක් බවත් ප්‍රකාශ කරන ලදී. අප සැමදාම ජනතාවට අවශ්‍ය කටයුතු ඉටු කල සභාවත් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම අරගලයෙන් පසුව ගිය සිකුරාදා දින මාස 7කට පසුව පුත්තලම් දිස්ත්‍රික් සංවර්ධන කමිටුව පැවැත්වූ බවත් එතනදී දිසාපතිතුමා මෙන්ම දිස්ත්‍රික් කමිටුවේ සභාපතිතුමා සිටියදී සභාවක් වශයෙන් ගොවීන්ට අවශ්‍ය කල බීජ ලබාදෙමින් අවශ්‍ය වගාබිම් ඇති කිරීමට පුරෝගාමී මෙහෙවරක් ඉටු කලේ අපි බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.අප ලබා දුන් සහයෝගයත් සමඟ ගොවි බිම් 53ක් ඇති කර ඇති බවත් එහි පසුවිපරමක්ද යන බවත් ඊයේ ආණ්ඩුකාරතුමා සමග පැවති වයඹ පලාතේම රැස්වීමේදී අප සභාව අගය කල බවත් ප්‍රකාශ කරන ලදී.කෘෂිකර්මයට සහයෝගය ලබා දීමට පණතේ සඳහන් වී නොමැති බවත්,නමුත් අප කමිටු සභාපතිවරුන් සමඟ සාකච්ඡා කර වැඩසටහනක් සකස් කර මෙලෙස ජනතාව අතරට ගෙන යාමට කටයුතු කිරීමට අපට හැකි වූ බවත් අද දිනද ගරු උපසභාපතිතුමා සමඟ කිරිමැටියාන ප්‍රදේශයේද රජයේ නිලධාරීන් විසින් වගා බිමක් ආරම්භ කල බවත් එයට සහභාගී වූ බවත් ප්‍රකාශ කරන ලදී.ගොවි කමිටු වලට වසර තුනකට බදු ලබා දීමට නීතියක් සකසමුයැයිද ගරු ආණ්ඩුකාරතුමාද පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.ආර්.ඩී.බී.බැංකුවේ 8%ක පොලියට වගා ණය ලබාදෙන බවත් ගෙවත්තක වගා කලහොත් විශාල ප්‍රතිලාභ ලැබෙන බවත් සියළුම දෙනාට ඉපදුනු පොලොවේ දෙයක් සිටුවීමට යුතුකමක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. රට එක්තැනකට ගෙන ඒමට ඒ දෙයට යොමු වන ලෙසත්,තරුණ තරුණියන් ගොවි බිමට ගෙන ඒමට අවස්ථාවක් සකස් කර ගන්නා ලෙසත්, පරිසර කමිටුව මඟින් එය සිදු කරන ලෙසත් සභාවේ ඉඩම් ටික ඒ සඳහා ලබා දෙමුයැයිද ප්‍රකාශ කරන ලදී.වයඹ අභිමානය ඉදිරියට කරගෙන යාමට සියළුම දෙනාට ශක්තිය ධෛර්යය ලැබේවායිද ප්‍රාර්ථනා කරන ලදී.

05. 2022-10-21 වන දින ස්වයං රැකියා උත්පාදන වැඩසටහනක් පැවැත්වීමට හැකි වූ බවත්, ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

06. වයඹ පලාත තුළ ක්‍රියාත්මක CAT 2020 වැඩසටහනට අදාලව විද්‍යුත් ගෙවීම් ක්‍රමවේදය පිළිබඳව නිරීක්ෂණය කිරීම හා එම ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම මත 2022-10-21 දින සබරගමුව පළාත් පාලන කොමසාරිස්තුමා, ගොඩකවෙල ප්‍රාදේශීය සභා ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුන්,ලේකම්තුමිය,ප්‍රධාන කලමනාකරණ සේවා නිලධාරීතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයද සහභාගී වූ එම වැඩකටයුතු සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.ඔවුන් දැන් අප සභාව දෙස බලා එය සකස් කිරීමට සූදානම් වන බවත්, අප ඒ තත්ත්වයට පැමිණ තිබීම ගැන ඔවුන් පුදුම වූ බවත් ප්‍රකාශ කරන ලදී.

05.වයඹ පළාතේ සියළුම පළාත් පාලන ආයතන වලට තම සේවාවන් ඒකාකාරී ලෙස පවත්වාගෙන යාම පහසු කිරීම සඳහා වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද "කාර්ය පටිපාටි සංග්‍රහය" සකස් කිරීම සඳහා තම දැනුමෙන් කුසලතාවයෙන් දායකත්වය දැක්වූ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඒ.එෆ්.පී.ප්‍රනාන්දු මහතා වෙත පළාත් පාලන කොමසාරිස් කේ.එම්.එච්.එස්.කේ.ජයලත් මහතා විසින් ප්‍රශංසා ලිපි ප්‍රදානය කරන ලදී .වයඹ අභිමානය ගෙන ඒමට ලේකම් මහතා විශාල කාර්යය භාරයක් සිදු කල බවත් ස්තූතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

06."වයඹ පළාතේ අභිමානය" නමින් සංකේතවත් වන වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය අතර මේ වන විට පළාත් පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාධාරීන් 07 දෙනෙකු සිටින අතර මෙය සභාවක් ලෙස ඉතාමත් වටිනා සම්පතක් බව ප්‍රකාශ කරන ලදී.මෙය විශාල සම්පතක් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

07. 2022ඔක්තෝබර් මස පහත සඳහන් මාර්ග වල කඩතොළු ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි විය. ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට මාගේ ස්තූතිය පුද කරන ලදී.

- ගොරකාගස් හන්දියේ කිඹුල්ගාල මාර්ගය
- මැල්ලව බාලසූරිය මහතාගේ නිවස අසල මාර්ගය
- වෙන්නප්පුව මාටින්ද පෝරස් මාර්ගය
- දුම්මලදෙණිය වැව අසල මාර්ගය
- වෙන්නප්පුව කනත්ත අසල මාර්ගය

**03.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

(i). ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න අංක 01 ගරු සභාපතිතුමා විසින් පහත පරිදි ඉදිරිපත් කරමින් පිළිතුරු ලබා දෙන ලදී.

ප්‍රශ්නය- 2018/2019/2020/2021/2022 යන වර්ෂ වල වාර්ෂික අයවැයෙන් ජ්‍යේෂ්ඨ පුරවැසි අරමුදල සඳහා වෙන් වූ මුදල කොපමණද?

පිළිතුර-
විවිධ සමාජ සංවර්ධන වැඩසටහන් යටතේ ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා මුදල් වෙන් කර ඇත.වර්ෂයට අදාළ වෙන් කිරීම් පහත දක්වා ඇත.

2018-රු.10,000.00

2019- රු.10,000.00

2020-රු.10,000.00

2021-රු.50,000.00

2022-රු.50,000.00

ප්‍රශ්නය- එක් එක් වර්ෂ වල අරමුදල මඟින් ක්‍රියාත්මක කල වැඩසටහන් මොනවාද?

පිළිතුර -

2018-වෙනත් විෂයන් සඳහා වැය මාරු කර ඇත

2019- වෙනත් විෂයන් සඳහා වැය මාරු කර ඇත

2020- වෙනත් විෂයන් සඳහා වැය මාරු කර ඇත

2021-රු.50,000 වෛද්‍ය ආධාර සඳහා වැය මාරු කරඇත(1.0.7.6 යටතේ)

2022- 2022-09-09 වන දින ජ්‍යේෂ්ඨ පුරවැසි වැඩ සටහන පවත්වන ලදී.

2021දී වැය මාරු කල වැය ශිර්ෂය සඳහන් කල බවත් 2018/2019/2020 වර්ෂ වලදී වැය ශීර්ෂ වලට මාරු කල බව සඳහන් කල නමුත් විශය සඳහන් නොලක බවත් ඒවා කුමක් සඳහා මාරු කලේදැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

එය අදාල නිලධාරීන් විසින් සඳහන් කර නොමැති බවත් ලේකම් මහතාට ඒ සඳහා අවස්ථාව ලබාදෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව 2018/2019/2020 යන වර්ෂ වල අයවැය ප්‍රකාශයෙන් වැය ශිර්ෂයක් ලෙස එය ඉවත් නොකර රු.10,000ක මුදලක් වෙන් කර තිබෙන බවත්,වසර අවසානයේ අයවැය සකස් කරන ලෙසම අවසන් ගිණුම නිකුත් කල යුතු බවත් එය සකස් කිරීමේදී 12/31 දිනට ඉතිරි වූ මුදල් සියල්ල වැය ශිර්ෂ මාරු කර මුදල් අවශ්‍ය වැය ශිර්ෂ වලට යොදවා අනෙකුත් වැඩ සටහන් ක්‍රියාත්මක කරන බවත්,මෙය උපකල්පිත අයවැයක් බවත් එහිදි

උපකල්පනය කරන මුදලම නොලැබෙන බැවින් එම නොලැබුණ මුදල් වැය ශිර්ෂ මාරු කර කපා හරින බවත් ප්‍රකාශ කරන ලදී.2021දී හදිසියේ වෛද්‍ය ආධාර සඳහා අවශ්‍ය වූ බැවින් 1.0.7.6 යටතේ එය මාරු කර වෛද්‍ය ආධාර ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

දෙසැම්බර් මාසයේ කොට්ඨාසයෙන් එක් ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු බැගින් ගෙන්වා උපහාර පිදීමක් සූදානම් කර ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී,

ඒ සඳහා තෝරා ගන්නේ කෙසේදැයි ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එය සලකා බලමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප්‍රශ්නය- එම එක් එක් වැඩසටහන සඳහා වැය කල මූල්‍ය වටිනාකම කොපමණද?

පිළිතුර-

2018- රු.0

2019- රු. 0

2020- රු.0

2021-රු.50,000

2022-රු.28,480.00

(ii). ගරු මන්ත්‍රී ටී.බී.ඕ.ඇන්ටනී කුමාර් මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න අංක 02 ගරු සභාපතිතුමා විසින් පහත පරිදි ඉදිරිපත් කරමින් පිළිතුරු ලබා දෙන ලදී.

ප්‍රශ්නය- සෞභාග්‍යයේ මංපෙත් වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය සඳහා වෙන් වූ මුදල කොපමණද?

පිළිතුර - එක් ග්‍රාම නිලධාරී වසමක් සඳහා රු.2,000,000.00 බැගින් (ලක්ෂ 20 බැගින්)

ප්‍රශ්නය - සභා බල ප්‍රදේශය තුළ එම වැඩසටහන යටතේ සංවර්ධනය වූ මාර්ග මොනවාද?

පිළිතුර- මාර්ග 136ක තොරතුරු මේ සමඟ අමුණා ඇත

ප්‍රශ්නය - එම මාර්ග වල දුර ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණද?

පිළිතුර- ඇමුණුමේ සඳහන් කර ඇත

ප්‍රශ්නය - එම සංවර්ධනය කල මාර්ග සඳහා වැය වූ මුදල වෙන් වෙන්ව කොපමණද?

පිළිතුර - ඇමුණුමේ සඳහන් කර ඇත

ගරු මන්ත්‍රී ටී.බී.ඕ.ඇන්ටනී කුමාර් මහතා මෙහිදී පවසා සිටියේ print කර එවනවාට වඩා මෙහි pdf file එක ලබාදීම සුදුසු බවයි.

එය එලෙස ලබාදෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(iii). ගරු මන්ත්‍රී ටී.බී.ඕ.ඇන්ටනී කුමාර් මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න අංක 03 ගරු සභාපතිතුමා විසින් පහත පරිදි ඉදිරිපත් කරමින් පිළිතුරු ලබා දෙන ලදී.

ප්‍රශ්නය- වෙන්නප්පුව ලුණුවිල හංදිය වැසි ජලයෙන් යටවීම වැළැක්වීම සඳහා ශා.සේවියර් මාවතේ වෙරළ දක්වා ඉදි කිරීම් ආරම්භ කල කාණුව ඉදි කිරීම් අඩාල වූ හේතුව කුමක්ද?

පිළිතුර - කෙතරම් යෝජනා කලත් කෝටි 7 මුදල ගැනීමට නොහැකි වූ බවත්, ජනාධිපති ලේකම් කාර්යාලයට තමාව රැගෙන ගොස් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මෙය ලබා දුන් බවත් නමුත් වැඩක් කර ගැනීමට නොහැකි වූ බවත් ඒ පිලිබඳව තමා දුක් වන බවත් ප්‍රකාශ කරන ලදී. දීපු කොන්ත්‍රාත්කරු මීටර් 200 පමණ සිදු කර තිබූ බවත් ඉතිරිය කර ගැනීමට නොහැකි වූ බවත් සියල්ලම

සැලසුම් කර තිබියදී එය එසේ සිදු වූ බවත්,නමුත් හොඳ වේලාවට ප්‍රධාන මාර්ගයේ වැඩ කටයුතු ආරම්භ කල බැවින් ගිය සතියේ NEM එකෙන් මෙය භාරගත් බවත්, පාරේ වැඩ කටයුතු සිදු කරගෙන යාමේදී ජලය බැස්සවිය යුතු බැවින් නැවත එය ආරම්භ කරන බවත් ප්‍රකාශ කරන ලදී. මෙම කර්මාන්තය මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ එම ආයතනය සමඟ ගිවිසුම්ගතව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් බවත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රශ්නය - එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල කොපමණද?

පිළිතුර - රු.75,398,771.52

ප්‍රශ්නය - එම ව්‍යාපෘතිය සඳහා මෙතෙක් සිදු කල සංවර්ධන කටයුතු සඳහා ගෙවීම් කල මුදල කොපමණද?

පිලිතුර - සම්පූර්ණ දුර මීටර් 1150 වන අතර ඉන් මීටර් 205 දුරක් අවසන් කර ඇති අතර ඒ සඳහා කිසිදු ගෙවීමක් සිදු කර නොමැති බව හලාවත මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් තොරතුරු ලබා දී ඇත

මෙය අප බල ප්‍රදේශයේ පාරක් බැවින් ද, අප ජල පද්ධතියට අවහිරයක් වේදැයිද,අපට අයත් කාණු සඳහන් වන්නේදැයිද යන්න බැලිය යුතු බවත් මෙහි PROJECT REPORT එක හෝ සභාවට ලබා දී නොමැතිදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදි.

එම වාර්තාව ඉංජිනේරුවන් මාර්ගයෙන් සාකච්ඡාවට ගෙන ආ බවත්,එහි පිටපතක් ලිපි ගොණුවල තිබේයැයි නොසිතන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සේවියර් මාවතේ භාගයක් දුරට මෙය සකස් කර ඇති බවත්, මොවුන්ගේ වාර්තාවේ මාර්ගය උස් කරන ප්‍රමාණය සමඟ එය අප මට්ටමට උඩින්ද පහළින්ද යන්නේ යන්න නොදන්නා බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

එම මට්ටම NEM හි ඉංජිනේරුවරුන් සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරුන් විසින් එකතු වී ලබා ගත් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ වන්නේ නම් හොඳ බවත්,මීට පෙර ලුණුවිල හන්දියේ,කොස්ගස් හන්දිය ජලය, පෙස්ටස් පෙරේරා මහතාගේ නිවස අසල ජලය හිටින්නේද එතැන තිබූ බෝක්කුව ඉවත් කර මාර්ගය පමණක් සකස් කල නිසා බවත්, වසර ගණනාවක් එම ගැටළුව තිබෙන බැවින් තමන් මෙය විමසූ බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මන්ත්‍රීවරුන්ද මේ පිළිබඳව විමසීම් කරන ලදී.

මෙහි DRAWING එක මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා සභාගත කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ නිවස අසල සහ වයික්කාල දුම්රිය හරස් මාර්ගය ආසන්නයේ විශාල ජල කඳක් එකතු වූ බවත් ,NEM එකෙන් මාර්ග සංවර්ධනය කරන බවත් පොදු ඇළට ජලය එකතු කරන බවත්,වෙනදාටත් වඩා වතුර ප්‍රමාණයක් මෙම පොදු ඇළට පැමිණෙන බවත් එබැවින් පොදු ඇළට පහළට වීමට එක්ස්කැවේටරයක් මඟින් හෝ සුද්ද කරන ලෙසට ඉල්ලීමක් කරන ලෙසත්, නැතිනම් එයද සභාව මඟින් සිදු කිරිමට සිදු වෙන බවත් ජනතාව අපහසුතාවයට පත් වන බවත් ප්‍රකාශ කරන ලදී.

එහි ප්‍රධාන ගැටළුව විසඳුන බවත්, කාණු පද්ධතිය දුම්රිය මාර්ගය යටින් ගොස් අනාත අගලට එකතු වන බවත්,අවසානයේ එම ගැටළුව අප සභාවට පැමිණෙන බවත්,එම මාර්ගය රේල් පාර අයිනෙන් යන බවත් නමුත් එහි ගෙවල් සාදා ඇති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

සති දෙකෙන් දෙකට තමන් සමඟ ඉදි කිරීම් කරන පිරිස සාකච්ඡා පවත්වන බවත්,ඒ සඳහා ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාව යොමු කරවීමට හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාර්ග සංවර්ධන අධිකාරිය සතුව කැට තිබෙන බවත්, ‘‘කරුණාකරලා හෝටලය‘‘ අසලින් මුහුදට යන බැවින් අඩි දෙකේ පමණ කැට කීපයක් දමා ගතහොත් මෙම ගැටළුව විසඳා ගත හැකි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

සහනගම පිට්ටනිය අසල අප සැකසූ වැට ගඟට වැටී ඇති බවත්,ඒ සඳහාද විශේෂ අවධානය යොමු කර ගල් යොදා හෝ එය සකස් කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

ගඟට වැටුන වැට ගත් බවත්, දකුණු ඉවුර ගල් දමා ආරක්ෂා කර ඇති බැවින් අපට අයත් ඉවුර සෝදා පාළුවට ලක් වී ඇති බවත්, අප සැදූ pavilion එක අසලටම එය පැමිණ ඇති බවත්, එය සභාවට කිරීමට අපහසු බවත්,ගංගා නිම්න සංවර්ධණ ව්‍යාපෘතියක් පැමිණියහොත් එය ගරු සභාපතිතුමාට ඉදිරිපත් කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු අරුන්දික ප්‍රනාන්දු ඇමතිතුමාට පවසා එය කරගැනීමට හැකිවේයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ කොට්ඨාසයේ කාණු මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් බඳින බවත්, කාණු කැට ගලවා දමා ඇති බවත් නිවෙස් වලට යන මාර්ග සඳහා සභාව මඟින් කාණු කැට දැමූ බවත් එබැවින් කඩිනමින් ඒවා සභාව වෙත ගෙන එන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රීතුමා තමන් සමඟ සම්බන්ධ වූ බවත්, අවශ්‍ය ලිපිය තමන් මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමන් හා ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා කුඩා වැස්සකදී වුවද රන්දියගම ගැටළුවකට මුහුණ දුන් බවත්, මහා මාර්ගයෙන් එන ජලය පැමිණ රන්දියගම යටවූ බවත්, ඉංජිනේරුවරුන් සිදු කිරීමට බෑ යැයි පැවසීමේදී තමන් ලක්ෂ 90ම ගෙන ආ බවත් ,තම මාමාගෙන් ඉඩම් කැබැල්ලක්ද ඉල්ලා ගෙන ළිං 4ක් සාදා මෝටරයක් ගෙනැවින් ලක්ෂ 90න් වැඩ කටයුතු අවසන් කල බවත්, ජලය ආපු ගමන් මේ වන විට එම ගැටළුව අවසන් වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සෝෂාව......

## 04.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. දංකොටුව මාළු වෙළඳපොල අපජල පිරිපහදු පද්ධතිය ඉදි කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම අනුව එම ආයතනය විසින් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ඇස්තමේන්තු මුදලින් 5%ක උපදේශන සේවා ගාස්තු ඉල්ලා ඇති බැවින් ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

පළමුව ලක්ෂ 60කට ඇස්තමේන්තුගත කල බවත්, එම ආයතනය තවත් යම් මුදලක් එකතු කර මෙය සිදු කර දෙන බවට පැවසූ බවත්, එබැවින් කෝටි ගණනක් මුදල් වැය නොකර එමඟින් කර ගත හැකි බවත්, ආණ්ඩු පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් ගොස් එය නිරීක්ෂණය කල බවත්, භාණ්ඩ මිල වැඩිවීම මත තවත් ලක්ෂ 30ක් 40ක් හෝ ඉල්ලන්නේ නම් එමඟින් මෙම සේවාව ලබා ගනිමුයැයිද,මන්ද ලක්ෂ 190ක් වැය කරනවාට වඩා එය හොඳ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

- ✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙම ගැටළුව බොහෝ කලක සිට තිබෙන ගැටළුවක් බවත්, ලක්ෂ 40 ක් දක්වා නිර්මාණ වැඩ අධිකාරී මහතාට අත්සන් කල හැකි බවත් එතැනින් එහා ඉංජිනේරුවරුන් අත්සන් කරන බවත් ඒ සඳහා ඔවුන්ගේ අකමැති වීම මත මෙය අත්සන් කර ගැනීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී.මෙය ජල සම්පාදන ආයතනයත් සමඟ එකතු වී කරගන්නා ලෙසත් පෞද්ගලික ආයතනයක් සමඟ මෙය කිරීමට නොහැකි බව මොවුන් පැවසූ බවත් නැවතත් නිර්මාණ වැඩ අධිකාරී මහතා ලවා විමසීමේදී එයට ඉන්ජිනේරු මහතා අකමැති වූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මේ සඳහා දැනට කුරුණෑගල ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ ඉංජිනේරුවරුන් සමඟ සාකච්ඡා කල බවත් ප්‍රකාශ කරන ලදී. ගියවරද ඔවුන්ගෙන් වාර්තාවක් ගත් විට මෙලෙසම ගාස්තු ඉල්ලූ බවත් තමන් එම අවස්ථාවේදී ඔවුන්ට පැහැදිලිවම මෙයට ඇස්තමේන්තු ඉදිරිපත් කර එය ඔබ විසින්ම ක්‍රියාත්මක කර දෙන ලෙසට ලිඛිත ඉල්ලීමක් කර තිබූ බවත් එය ක්‍රියාත්මක නොකරන බව පවසා ඇස්තමේන්තු සැකසීමට පමණක් ගාස්තු ඉල්ලා තිබූ බවත් තමන් එය නොගෙවූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. දැන් නැවතත් මෙයට එකඟතාවය ඉල්ලන බවත් මෙය නීත්‍යානුකූල වැඩ පිළිවෙල නිසා ඉංජිනේරුවරුන් මෙයට අත්සන් කරන බවත්, ගලපා ගැනීම් කිරීමට හැක්කේ අප සීමාවේ තිබෙන දේට පමණක් බවත් ප්‍රකාශ කරන ලදි.

මෙම ආයතනය බැක්ටීරියාවක් දමා මෙය සිදු කරන බවත්,ටැංකි තුනක් තිබෙන බවත් තවත් ටැංකියක් බැඳීමට සිදු වන බවත් ඔවුන් ටැංකි බැඳීමක් සිදු නොකරන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. ජල සම්පාදන මණ්ඩලයේ ජලය මෙම මාකට් එක පිරිසිදු කිරීමට අප දැනට භාවිතා කරන බවත් එම ජල වැය වීම මෙමඟින් අඩු කර ගැනීමට හැකි වන බවත් නැවත ජලය භාවිතා කිරීමට හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී. දුරගන්ධයක්ද නොඑන බවත් මෙය යථාර්ථය බවත් ජල සම්පාදන මණ්ඩලය මඟින් පානීය ජලය ලබා දෙන බවත්, වෙනත් ආයතන මොවුන් සමඟ සම්බන්ධ වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මන්ත්‍රීවරුන්ද ගොස් මෙය බැලූ බවත්,ලක්ෂ 110 පමණ මේ සඳහා වැය වේයැයිද, තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ලබන සතිය වන විට මෙය අවසන් කල යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මෙහි නීතිය පිළිබඳ කරුණු පවසන ලෙස ලේකම් මහතාට ප්‍රකාශ කරන ලදී.

වසර කීපයක සිට මෙම අපජල පිරිපහදු ඒකකය ඉදි කිරීම සඳහා කටයුතු කල බවද, එහෙත් මෙහි ඇස්තමේන්තු මුදල රු.ලක්ෂ 40 ඉක්මවා තිබූ බැවින් එය පලාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහතා විසින් ඇස්තමේන්තු අනුමත කල යුතු බවද, ඒ අනුව පලාත් පාලන කොමසාරිස්තුමාට මෙම පෞද්ගලික ආයතනයක් මඟින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුව ඉදිරිපත් කල අතර ඒ සඳහා අනුමැතිය නොලැබුණ බවද මේ සඳහා ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය මඟින් උපදේශන සේවාව හා ඇස්තමේන්තු සකස් කර ගන්නා ලෙස උපදෙස් ලැබී ඇති බවද ලේකම් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.තවද ඉංජිනේරු මහතාගේ අනුමැතිය නොමැතිව මෙය ඉටු කල නොහැකි බවත් සභාව මඟින් එය අභිබවා තීරණ ගන්නේ නම් නිලධාරීන් ලෙස එයට මැදිහත් විය නොහැකි බවද මෙය නීත්‍යානුකූල මට්ටමින් සිදු කල යුතු බවද ලේකම් මහතා විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

සභාවට අනවශ්‍ය ලෙස වියදමක් යන්නේ නම් මෙය සද්භාවයෙන් සිදු කරන ලෙසත්,කොහේවත් සිටිනා පිරිසකට කෝටි ගණන් මුදල් ලබා දීමට අවශ්‍ය නොමැති බවත්,මෙය මහජනතාවගේ මුදල් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි project එකෙහි වටිනාකම කීයදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එය සකස් කිරීමට මෙම 5%ක මුදල අනුමත කර දෙන ලෙස ඉල්ලන බව ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

එම ආයතනය රජයේ පිළිගත් ආයතනයක්දැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

මෙය රජයේ ආයතනයක් බව ලේකම් මහතා පිළිතුරු ලබාදෙන ලදී.

එසේ නම් මේ සඳහා කොමසාරිස්තුමාගේ අනුමැතිය ඉල්ලා යවන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

නිලධාරීන් විසින් තෝප්පුව හංදියේ තිබෙන වැසිකිළි පද්ධතිය සකස් කර එක්ලක්ෂ හැත්තෑ දහසක උපදේශන ගාස්තු අය කල බවත්,පොල් වළක් තරම් වලක් සකස් කර ඇති බවත්, ජනතාවගේ මුදල් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 04

දංකොටුව මාළු වෙළඳපොල අපජල පිරිපහදු පද්ධතිය ඉදි කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම අනුව එම ආයතනය විසින් ඇස්තමේන්තුගත මුදලින් 5%ක උපදේශන සේවා ගාස්තු ඉල්ලා ඇති බැවින් කොමසාරිස්තුමාගේ අනුමැතිය මත එය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

ii. කුරුණෑගල පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් අනුමත කර එවා ඇති මාර්ග අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මේ සඳහා අනුමැතිය ලැබෙන්නේ කවදාදැයි ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා විමසා සිටින ලදී.

අද දින මහා සභා අනුමැතිය අවසන් අනුමැතිය බවත්,නැවත අනුමැතියක් අවශ්‍ය නොවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 05

පලාත් පාලන කොමසාරිස්තුමාගේ අංක ව/පපාදෙ/04/03/02/10/21 හා 2022.10.17 දිනැති ලිපිය අනුව වෙන්නප්පුව බල ප්‍රදේශයේ වර්ෂාවෙන් හා ජල ගැලීම් වලින් හානියට පත් මාර්ග පිළිසකර කිරීම සහ අත්‍යවශ්‍ය පොදු පහසුකම් නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම සඳහා වන යෝජනා (39) සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අවශ්‍ය නොවන බැවින් ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

Iii. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතු මාර්ග 3873ක් ගැසට් පත්‍රය මගින් දෙවන වර ප්‍රකාශයට පත් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මෙහිදී දෙවන වර ගැසට් කිරීම යනුවෙන් සඳහන් කිරීම පිළිබඳවත්,එහි නීතිමය තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රී ටී.කී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.සෞභාග්‍යයේ මංපෙත් වලින් සිදු කල මාර්ගයක් පිළිබඳව තමන් විමසීමක් කල බවත් එම මාර්ගයේ අයිතිකරු විසින් ඉදිරිපත් කල ඉල්ලීම් ලිපියද තවමත් සභාගත නොකල බවත් තම කොට්ඨාසයේද ගැටළු දෙකක් තිබෙන බවත්,එම මාර්ග ඇතුළත්ද නැතිද යන්න පිළිබඳව ගැටළුවක් තිබෙන බවත්,මෙහි 3873හි ඇතුළත් මාර්ග මොනවාද යන්න නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී.ගැසට් නොකර සංවර්ධනය කල මාර්ග ඇස්පනාපිටම දැක ඇති බවත් එලෙස තිබියදී මෙයට අනුමැතිය ලබා දෙන්නේ කෙසේදැයිද විමසා සිටින ලදී.

පළමු වර ගැසට් කර විරෝධතා පැමිණි මාර්ග තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

විරෝධතා තිබෙන මාර්ග මොනවාද යන්නත් ලේඛණයක් ලබලා දෙන ලෙසත් නැතිනම් මෙයට එකඟවිය නොහැකි බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

- ✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව සභා බල ප්‍රදේශයට අයත් මාර්ග 4013ක් GIS තාක්ෂණය උපයෝගී කරගනිමින් විධිමත් පරිදි සිතියම් ගත කර පලාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2022-ජුනි-10 දින පළමු වර ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කල බවද, එය ගැසට් පත්‍රයේ පලවූ පසුව මෙම මාර්ග පිළිබඳ සියළු විස්තර සියළු දෙනාම දුටුව හා සමාන බවත්, එය පිළිගන්නා බවත් සැලකිය යුතු බවද ප්‍රකාශ කරන ලදී. ඒ අනුව පලමු වර ගැසට් ප්‍රකාශය නිකුත් වී මාස 3ක් ඇතුළත විරෝධතා ඇත්නම් ඉදිරිපත් කල යුතු බවද,එලෙස ලැබෙන විරෝධතා දෙපාර්තමේන්තුවේ උපදෙස් මත පත් කල විරෝධතා පරීක්ෂා කිරීමේ කමිටුව වෙත යොමු කරන බවද, විරෝධතා සලකා බැලීමේ කමිටුව විසින් විරෝධතා ඉදිරිපත් කල සියළු පාර්ශවයන් කැඳවා විරෝධතා පිළිබඳ පරීක්ෂා කර කමිටුවේ තීරණ දැනුම් දෙන බවද ඒ අනුව දැනට මෙම සභාව වෙත ඉදිරිපත් වී ඇති සියළු විරෝධතා පිලිබඳ කමිටු තීරණ ලැබී ඇති බැවින් එම විරෝධතා ඇති මාර්ග ඉවත් කර ඉතිරි මාර්ග 3873ක් නැවත දෙවන වර ගැසට් පත්‍රයේ ප්‍රකාශ කල යුතු බවද එය මාස 06ක් ඇතුළත සිදු කිරීමෙන් පමණක් නීත්‍යානුකූල වන බවද ප්‍රකාශ කරන ලදී.

නැවත විරෝධතා ගොණු කිරීමට හැකි බවත්,අධිකරණ කටයුත්තකදී එය වැරදියැයි පැවසුව හොත් එනම් සභාව වැරදියැයි පැවසුවහොත් එයට කුමක් වන්නේ දැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.විරෝධතා ඉදිරිපත් වන මාර්ගයේ ඉල්ලීම් ලිපියවත් සභාව සතුව නොමැති නම් එය අදිකරණයේදී ඔප්පු වුවහොත් කුමක් සිදු වන්නේදැයිද විමසා සිටින ලදී.මෙය අප සතු මාර්ගයක් ලෙස සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් කුමක් සිදු වන්නේ දැයිද තවදුරටත් විමසා සිටින ලදී.

සභාව මගින් සමීක්ෂණයක් සිදු කරන බවත්,තාක්ෂණය හරහා බණ්ඩාංක මගින් සිතියම් ගත කර පළමු වර ගැසට් පත්‍රයේ ප්‍රකාශ කරන බව ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

සිදු කර තිබෙන ක්‍රියා පටිපාටිය නිවැරදි බවත්, එයට පිටින් ගොස් මාර්ග සකස් කර ඇති බැවින් එවැනි සිද්ධියක් සිදු වුවහොත් කුමක් කරන්නේද යන්න ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

විරෝධතා ඉදිරිපත් කර එම මාර්ගය ඉවත් කර ගතහැකි බව ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

පාරවල් සෑදුවේ එම මාර්ග වල සියළු දෙනාගේම ලිඛිත අවසරයක් ගෙන බවත්,ඉන් පරිභාහිරව සිදු වී ඇත්නම් ඔවුන්ට පැමිණ විරුද්ධ විය හැකි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.සභාව මගින් තාර දමා වසර ගනනාවක් වන බවත් ඒ පිළිබඳව උසාවිය මගින්ද සලකා බලන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම පුද්ගලයාට පාරට තාර දමද්දීම විරුද්ධ විය හැකි බවත්, එසේ සිදු නොකල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඕනෑම පාරක් සභාවට පවරාගත හැකි බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා නීතිය දැන ගෙන කතා කරන බවත්,සභාවක් ලෙස යායුතු නීතිමය ක්‍රියාපටිපාටියෙන් තොරව වැඩ කටයුතු කර ඉන් පසුව එම පුද්ගලයා අහක බලන් හිටියායැයි පැවසීම නීතියදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

එසේ සිදු වී නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එම පුද්ගලයා ඉල්ලීම් කල ලිපිය සභාවේ තිබේදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

මෙම මාතෘකාවට භාජනය වන මාර්ගය අයත් පුදගලයා එය තම පෞද්ගලික පාර බවත්,එය සංවර්ධනය කලේ අපරාදේ බවත්,මෙයට ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා පැමිණ ගෙවීම කරන ලෙසට තවමත් තමා අසලට පැමිණ නොපැවසුව බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඔහු පැවසීම හෝ නොපැවසීම පිළිබඳව තමා නොදන්නා බවත් ,අදාල ලිපිය සභාගත කල බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

තවමත් කොන්ත්‍රාත්කරුට ගෙවා නොමැති බවත්,තමන් මනුස්සකමට කටයුතු කල බවත්, එම මාර්ගය ලබන සතිය වන විට ගලවා ඉවත් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ සිදු නොකරන ලෙස ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන ලදී.

රජයේ තක්සේරුවට එය සභාවට පවරා ගනිමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

සෝෂාව.....

ගරු මන්ත්‍රි එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා න්‍යාය පත්‍රයේ අංක 3 යටතේ ගරු සභාපතිතුමා යෝජනාවක් ඉදිරිපත් කල බවත්,එම 3873 ඇතුළත මෙම පවසන මාර්ගය තිබේදැයිද විමසා සිටින ලදී.

එය තුළ නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නැති එකක් වෙනුවෙන් කතා කර පලක් නොවන බවත්, මෙතැන ගැටළුවක් තිබේනම් සභාවේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ රජයේ මුදලින් අගතියක් සිදු වී ඇත්නම් ලිඛිතව පැමිණිලි කර අදාල පුද්ගලයාට 100%ක සාධාරණය ඉටු කරන ලෙසත් ගරු මන්ත්‍රී ඒල්.කේ .ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී. එම පුද්ගලයාට රජයේ ඕනෑ තරම් ආයතන තිබෙන බවත් ඒවාට ගොස් පැමිණිලි ඉදිරිපත් කර හැකි බවත්,නමුත් මෙතැන මාර්ග 3873ක් සම්බන්ධව යෝජනාව ඉදිරිපත් වී ඇති බැවින් ,පළමු වර ගැසට් කර දෙවන වර නැවත ගැසට් නොකලහොත් එහි ගැටළුවක් මතු වන බවත්,එබැවින් මෙය අනුමත කර සිටින ලෙස තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 06

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සභාව සතු මාර්ග 4013ක් 2022 ජුනි 10 දින පළමුවර ගැසට් කිරීමෙන් අනතුරුව මාස 03ක් ඇතුළත ලැබූ විරෝධතා පිළිබඳ සලකා බැලීමේදී මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග 06ක්, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග 47ක්, පුද්ගලික මාර්ග 80ක් හා විරෝධතා ඉදිරිපත් වූ මාර්ග 07ක් ඇති බවත් ඒ අනුව කමිටුව මඟින් ලබා දී ඇති නිර්දේශ මත වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතු මාර්ග 3873ක් දෙවන වර ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

(iv). 2023 වර්ෂයේ සභාවේ දේපල බදු දීමට අදාල ගිවිසුම් අනුමත කර ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මෙය යෝජනාව න්‍යාය පත්‍රයේ සඳහන් වී නොමැති බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

Whatsapp group එකට යොමු කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

Pdf file එවා තිබූ බවත්, ඊයේ උදයේ එවා තිබූ බැවින් එය පරිශීලනය කිරීමට කාලය ප්‍රමාණවත් නොවූ බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.එවා කියවීමටවත් වේලාව නොමැතිව අද දින මේ සඳහා අනුමැතිය ලබා දෙන්නේ කෙසේදැයිද තවදුරටත් විමසා සිටින ලදී.

එය ගරු මන්ත්‍රීතුමාගේ ගැටළුවක් බවත්,හදිසි වැඩකටයුත්තක් බැවින් එය එසේ යොමු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රයේ සඳහන් වී නොමැති බවත්,නීතියක් නොමැතිදැයිද, න්‍යාය පත්‍රයේ නිසි ලෙස සඳහන් වී නොතිබීම නිසා තමා විරුද්ධ බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 07<br><br>2023 වර්ෂයේ සභාවේ දේපල බදු දීමට අදාල ගිවිසුම් අනුමත කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.මෙම යෝජනාව න්‍යාය පත්‍රයේ සඳහන් කර නොමැති බැවින් මේ සඳහා තමන් විරුද්ධ බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.ඒ අනුව මේ සඳහා සභාවේ බහුතර අනුමැතිය ලබා දෙන ලදී. |

**b. ගරු මන්ත්‍රී යෝජනා**

(i). 2022 වර්ෂයේ අයවැය යටතේ බොරලැස්ස කොට්ඨාසයේ සංවර්ධනය කිරීම සඳහා වෙන් කර ඇති දකුණු බොරලැස්ස ඇන්ටනී මහතාගේ නිවස අසලින් ආරම්භ වන කාණු පද්ධතිය ඉදි කිරීම හා උතුරු බොරලැස්ස පතහ කාණු පද්ධතිය ඉදි කිරීම යන යෝජනා වෙනුවට බොරලැස්ස දුම්රියපල පාරේ සිට බණ්ඩිරිප්පුව ගාලවත්ත මායිම් පාර තාර දමා නඩත්තු කිරීම සහ උතුරු බොරලැස්ස ට්‍රෙවින් ප්‍රනාන්දු මාවත අබලන් වී ඇති බැවින් තාර දමා නඩත්තු කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මහා සභාවට යොමු කරන ලදී.

| |
|---|
| තීරණ අංක 08<br><br>2022 වර්ෂයේ අයවැය යටතේ බොරලැස්ස කොට්ඨාසයේ සංවර්ධනය කිරීම සඳහා වෙන් කර ඇති දකුණු බොරලැස්ස ඇන්ටනී මහතාගේ නිවස අසලින් ආරම්භ වන කාණු පද්ධතිය ඉදි කිරීම හා උතුරු බොරලැස්ස පතහ කාණු පද්ධතිය ඉදි කිරීම යන යෝජනා වෙනුවට බොරලැස්ස දුම්රියපල පාරේ සිට බණ්ඩිරිප්පුව ගාලවත්ත මායිම් පාර තාර දමා නඩත්තු කිරීම සහ උතුරු බොරලැස්ස ට්‍රෙවින් ප්‍රනාන්දු මාවත අබලන් වී ඇති බැවින් තාර දමා නඩත්තු කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

(ii). 2022 මාර්ග අලුත්වැඩියා කිරීම යටතේ ගෝනාවිල කොට්ඨාසයේ යායවත්ත මාර්ගය අළුත්වැඩියා කිරීම, නැදුන්වැටිය පාර අළුත්වැඩියා කිරීම,කිරාගාර ෂෝන් උළුකම්හල පාර අළුත්වැඩියා කිරීම සහ බංගලාවත්ත ජනපද පාර තැලවිල්ල අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මහා සභාවට යොමු කරන ලදී.

| |
|---|
| තීරණ අංක 09<br><br>2022 මාර්ග අලුත්වැඩියා කිරීම යටතේ ගෝනාවිල කොට්ඨාසයේ යායවත්ත මාර්ගය අළුත්වැඩියා කිරීම, නැදුන්වැටිය පාර අළුත්වැඩියා කිරීම,කිරාගාර ෂෝන් උළුකම්හල පාර අළුත්වැඩියා කිරීම සහ |

බංගලාවත්ත ජනපද පාර තැලවිල්ල අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

(iii). දකුණු දුම්මලදෙණිය ශාන්ත නිකුලා දේවස්ථානය අසලින් ආරම්භ වී නිශාන්ත මහතාගේ නිවස අසලින් අවසන් වන පලල අඩි 12 දිග මීටර් 200 පමණ වන මාර්ගය නැවත තාර දමා පිළිසකර කර "සමනළ පෙදෙස" ලෙස මාර්ගය නම් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මහා සභාවට යොමු කරන ලදී.

තීරණ අංක 10

දකුණු දුම්මලදෙණිය ශාන්ත නිකුලා දේවස්ථානය අසලින් ආරම්භ වී නිශාන්ත මහතාගේ නිවස අසලින් අවසන් වන පලල අඩි 12 දිග මීටර් 200 පමණ වන මාර්ගය නැවත තාර දමා පිළිසකර කර "සමනළ පෙදෙස" ලෙස මාර්ගය නම් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම් කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

(iv). 2022 වර්ෂයේ සංවර්ධන යෝජනා යටතේ ඇටඹගහවත්ත නව ප්‍රජා ශාලාවේ වැඩ ආරම්භ කිරීම වෙනුවට පහත සඳහන්මාර්ග ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසට ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාවට යොමු කරන ලදි.

- සෙන්දිරියාමුල්ල ඇටඹගහවත්ත ජනපදයේ පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම
- සෙන්දිරියාමුල්ල ග්‍රාමයේ බුලන පාර පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය
- සිංගක්කුලිය උදාර ජනපදයේ පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය

තීරණ අංක 11

2022 වර්ෂයේ සංවර්ධන යෝජනා යටතේ ඇටඹගහවත්ත නව ප්‍රජා ශාලාවේ වැඩ ආරම්භ කිරීම වෙනුවට පහත සඳහන්මාර්ග ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසට ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම් කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- සෙන්දිරියාමුල්ල ඇටඹගහවත්ත ජනපදයේ පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම
- සෙන්දිරියාමුල්ල ග්‍රාමයේ බුලන පාර පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය
- සිංගක්කුලිය උදාර ජනපදයේ පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය

(v). 2022 වර්ෂයේ මෝරුක්කුලිය කොට්ඨාසය සඳහා වෙන් කර ඇති මුදලින් පීතර වත්තේ ඇති පැති බැම්ම සහ මෝරුක්කුලිය ග්‍රාමයේ නිලධාරීන් සඳහා සේවා පියසට යන ඉඩම හා ගොඩනැඟිල්ල මිල දී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මහා සභාවට යොමු කරන ලදී.

තීරණ අංක 12

මෝරුක්කුලිය නාමල් උයන(සුනාමි ගම්මානය) ප්‍රජා ශාලා ගොඩනැඟිල්ල සහිත පර්චස් 36.63ක භූමිය මිල දී ගැනීම සඳහා එම ආයතනය විසින් රු.6,956,558.00ට අදාලව ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව අනුව මිල දී ගැනීම සඳහාත් ඒ සඳහා මෝරුක්කුලිය කොට්ඨාසය සඳහා වෙන් කර ඇති රු.ලක්ෂ 18 ක ප්‍රාග්ධන සංවර්ධන මුදල්ද, පුනරාවර්ථන වැඩ සටහන් සඳහා වෙන් කර ඇති

රුපියල් ලක්ෂ 6ක මුදලද, නිවාස ආධාර සඳහා වෙන් කර ඇති රුපියල් ලක්ෂයක මුදලද යොදා ගැනීමටත් සුදුසු බවත්, ඉතිරි මුදල වැය ශීර්ෂ මාරුවක් මඟින් ලබා ගැනීම සුදුසු බවත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

## 05. කාරක සභා වාර්තා සලකා බැලීම.

i. 2022.10.25 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සලකා බැලීම.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම වාර්තාවේ අවසන් පිටුවේ ග්‍රාමීය සංවර්ධන නාම පුවරු සකස් කර සවි කිරීම පිළිබඳව සඳහන් වන බවත්, එහිදී සාමාන්‍යයෙන් මාර්ග ඉදි කිරීමේදී නාම පුවරුවේ ඉදිරිපත් කල යුතු නිශ්චිත කරුණු තිබේද යන්නත්, එය ඉදි කිරීම අත්‍යවශ්‍ය කාරනාවක්ද යන්නත් විමසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙම මාර්ග සඳහා මාර්ග අමාත්‍යාංශය මඟින් මුදල් වෙන් කල බවත් එවිටම නාම පුවරුවට ඇතුළත් කල යුතු නිශ්චිත ආකෘතිය එවූ බවත්, දුර ,පළල යෝජනා කරන පුද්ගලයා වැනි නිශ්චිත තොරතුරු එවූ බවත් ප්‍රකාශ කරන ලදී. එබැවින් ඒ සඳහා ඇස්තමේන්තුවෙන්ම මුදල් වෙන් කල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම එවා තිබෙන ආකෘතිය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 13

2022.10.25 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ හා ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ii. 2022.09.16/ 2022.10.07 සහ 2022.10.21වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සලකා බැලීම.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා මෙහිදී කමිටුවට අදාල කාරණාවක් සම්බන්ධයෙන් කතා කිරීමට තිබෙන බවත්,පසුගිය මසද අප සභාවට වෙන් වූ ඉඩම් කොටසකට අදාල කාරණාවක් සාකච්ඡා කල බවත්,සැලසුම් කමිටුව මඟින් අනුමත කරන ඉඩම් කට්ටි කිරීම් අපගේ මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාවට අයත් නොවන්නේදැයිද විමසා සිටින ලදී.

එය කමිටුවට සම්බන්ධ නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් සැලසුම් කමිටුවේ ගැටළු මතු වූ පසුව එය සභාවට ගෙන එන්නේදැයිද ,සම්මත වූ වාර්තාවේ 40 වන පිටුවේ "ඉඩමක් කොටස් වන විට ආදායම් පරීක්ෂකවරුන්ගේ යම් දැනුමක් තිබිය යුතු බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. සැලසුම් කමිටුවේ යම් යම් සේ සිදු වන බවත්, එහි සිදු වන දේ මහා සභාවක් ලෙස අපට සෙවීමට නොහැකි බවත්,ඒවා කර්මාන්ත කමිටුවට වාර්තා වන්නේදැයිද නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී. සරලව ඒවා වාර්තා වූයේනම් හොඳ බවත්, " ලෙස

සඳහන් වන බවත්, පක්ෂයේ ජ්‍යේෂ්ඨ මන්ත්‍රීතුමෙකු වන ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විසින්ම එසෙ පවසා තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.අප සභාවේ ගැටළුවක් පැමිණි විට මහා සභාවට දැමූ බවත් නමුත් වෙනත් සභාවල කාරක සභා වාර්තා වලට ඇතුළත් කර මහා සභාව දැනුවත් කරන බවත්,අප සභාවේ මෙතරම් කාලයකට මෙය සිදු කර නොමැති බවත් දැන්වත් එය සිදු කරන ලෙසත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී .කර්මාන්ත කමිටුවේ කමිටු සභාපතිතුමාද සිටින බවත්,පළමු මහා සභාවේදීම කමිටුවලට වෙන් කල විෂය පථයන් ලබා දුන් බවත් මෙයද කමිටුවට අයත් බවත් නමුත් මෙය හංගා තිබෙන්නේ මන්දැයිද විමසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව ඉඩම් කට්ටි කිරීම හා අනෙකුත් තෝරා ගත් වෙනත් කාරණා තිබෙන බවත්,ඒවාට ගැසට් මඟින් බලය පවරා ඇති බැවින් ඒවා නැවත සභාවට දමන ලෙසට කොතැනකවත් සඳහන් නොවන බවද ප්‍රකාශ කරන ලදී.අනෙක් සභාවල සිදු කරන වැඩ කටයුතු නොදන්නා බවත්, තමන් ගැසට් එකට පිටතින් වැඩ කටයුතු කර අනවශ්‍ය ප්‍රශ්නයක් දමා ගැනීමට අකමැති බවත්, කමිටු පිහිටුවා තිබෙන බවත්,පරිසර බලපත්‍රයක් ලබාදෙන්නේ නම් එයට යායුතු නිලධාරීන්ව ගැසට් එකෙහි සඳහන් කර ඇති බවත් ඊට පිටතින් ලබා දෙන තිරණ තමන් පිළිනොගන්නා බවත්,ආදායම් පරීක්ෂක මහතෙකුට පමණක් තක්සෙරුවක් ලබා දිය හැකි බවත් තමන් එය පමණක් පිළිගන්නා බවත් එලෙස ඉඩම් කට්ටි කරන විට ගැසට් පත්‍රයේම අදාල නිලධාරීන්ව සඳහන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ගැසට් එකෙහි සඳහන් නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවකින් තීන්දු තීරණ ගතයුතු බවත්, අපට අයත් වන ඉඩම් කොටස, තක්සේරුව ගැනීම මෙම නිලධාරී මණ්ඩලය විසින් සිදු කල යුතු බවට සඳහන් වන බවත් ප්‍රකාශ කරන ලදී.වයඹ පලාත් ගිණුම් කාරක සභාවේදීද මෙම ගැටළුව කතා කල බවත්, මේ සඳහා කමිටුවක් පත් කරන ලෙසට දැනුම් දුන් බවත් ,වැඩ අධිකාරී, ආදායම් පරීක්ෂක මහතෙකු සහ ප්‍රධාන කලමනාකරණ සේවා නිලධාරීතුමාගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති බවත් ඉඩම් ,ඔප්පු තිරප්පු පරීක්ෂා කිරීමට, තක්සේරුව ලබා ගැනීමට හා සභාවට ලැබෙන ඉඩම් කොටස සුදුසු ස්ථානයක් පරීක්ෂා කර බලා ලබා ගැනීමට බලය ලබා දී ඇති බවත් ඒ අනුව මෙම වැඩ කටයුතු සිදු කරගෙන යන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම ක්‍රියාවලිය නිවැරදි බවත්,ඒ පිළිබඳව මහා සභාව දැනුවත් කිරීමට ක්‍රමවේදයක් නොමැතිදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට අභියෝග කිරීමක් නොව එය පිළිබඳව දැන ගැනීමට අමුණා එවන ලෙස පවසන බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

කොමසාරිස්තුමා චක්‍ර ලේඛයක් එවා ඉන් පසුව එම ඉඩමට පමණක් වෙනම ලිපියක් එවීම වැරදි බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

සැලසුම් කමිටුව මඟින් මෙය සිදු කිරීම ක්‍රියාවලිය බවත්,නමුත් මේ සියල්ල අවසානයේ මහා සභාවට ගෙනෙන බවත්, පක්ෂ විපක්ෂ එවිට අදාල නොවන බවත් ,එබැවින් කමිටු වාර්තාවට ඇතුළත් කර මහා සභාව දැනුවත් විය යුතු නොවේදැයිද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාව මහා සභාව මඟින්ම එම කමිටුව නියෝජනය කිරීමට නම් කල බවත්, රැස්වීම් කැඳවීමේදී එතුමාව කැඳවා නොමැති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා ආගමික වැඩ කටයුතු වල යෙදෙන බැවින් කාර්යබහුල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එතුමාව කැඳවන ලෙසත්, අවසානයේ කාණුවක් හිර වු වහාම සභාවට ගැටළුව එන බවත්,සෑම කට්ටි කිරීමක්ම මහා සභාවට යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 14

2022.09.16/ 2022.10.07 සහ 2022.10.21වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික

| |
|---|
| සේවා කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022-11-03 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

මෙම වාර්තාවේ 5 වන පිටුවේ 3වන කාරණය යටතේ "වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තෝරාගත් පාසල් වල 9 ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා පාසැල් දරු දැරියන් සඳහා ළමා අපචාර වැළැක්වීම පිළිබඳ වැඩසටහනක් සංවිධානය කිරීමට...." ලෙස සඳහන් වන බවත්,මෙය අර්ථාන්විත,කාලෝචිත වැඩ සටහනක් බවත්.මෙතැනදී තෝරාගත් පාසල් ලෙස සලකන්නේ කුමක්ද? යන්නත්,මෙවැනි වැඩ සටහනකදී පොලිස් නිළධාරියෙකු පමණක් සහභාගී කරවීම ප්‍රමාණවත් නොවන බවත්, දරුවන් පොලිස් නිල ඇඳුම දකින විට ගෞරවය නැති වී ඇති බව තම මතය බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.එබැවින් මෙතැනදී කුමන දෙයක් බලාපොරොත්තු වන්නේද?, ක්‍රියාත්මක වන වැඩ සටහන කෙලෙසද ක්‍රියාත්මක වන්නේ යන්නත්, මොන වගේ පාසල් තෝරා ගන්නේද යන්න පිළිබඳ දැනුවත් කිරීමක් බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා මෙම වැඩ සටහන සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ වී සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මනෝජ් සමරසිංහ මහතා මෙම විෂයට සම්බන්ධ කර ගැනීමට උත්සාහ කරන බවත්, අදාල කාල සීමාව තුළ කාල සටහන් විභාග පිළිබඳ නොදන්නා බැවින් පාසල් තෝරා ගැනීම සම්බන්ධව කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාට ගරුසභාපතිතුමාගේ ඉල්ලීමක් ඉදිරිපත් කර තිබෙන බවත්, වැය ශීර්ෂ සම්පූර්ණ කිරීමේ ආකල්පය මත මෙම කටයුත්ත යොමු කර ඇති බවත් අනුමැතිය එන තුරු බලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය ඉතාමත් කාලෝචිත ගැටළුවක් බවත්,මේ පිළිබඳව තමන් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාවද දැනුවත් කල බවත් ,තෝරාගත් පාසල් වලට වඩා ප්‍රදේශයේ තිබෙන සියළුම පාසල් වලට යොමු කිරීමට හැකි නම් හොඳ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.
පාසල් වල සිටින 9 ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා අපචාර වැරදි වැඩ වැඩි හරික් සිදු වන බවත්, අප ප්‍රදේශයේ පාසල් වලද ඒවා සිදු වූ නමුත් පාසල් වල කීර්තිනාමය සලකා ඒවා වසන් කරන බවත් නමුත් මේ නිසා විශාල ළමුන් සංඛ්‍යාවක් අගතියට පත් වන බවත් ප්‍රකාශ කරන ලදී.පාසල් වල අභ්‍යන්තර කටයුතු සඳහා පොලිසිය මැදිහත් නොවිය යුතු බවට මිල්ලෙනිය සිද්ධියත් සමඟ බොහෝ පිරිසක් දැනුවත් වූ බවත්,එසේ නම් පරිවාස හා ළමාරක්ෂණය ආයතනය තුළද පොලිස් නිළාදරීන් සිටින බැවින් ඔවුන්හෝ සම්බන්ධ කර මෙය සිදු කරන ලෙසත්,පාසල් වල විනයභාර අචාර්යවරුන් හා විදුහල්පතිවරුන් සිටින බවත් මේ සියල්ලම සම්බන්ධ කර පළාත් අධ්‍යාපන කාර්යාලය හරහා විධිමත් වැඩ සටහනක් කරන්නේ නම් හොඳ බවත් ,පාසල් වල වසංගතයක් ලෙස මෙය සිදු වන බවත්,මෙය ඉදිරියට ගියහොත් නැවැත්වීමට නොහැකි තත්ත්වයට පත් වන බවත්,මත්ද්‍රව්‍යය පමණක් නොව මේ වන විට අපචාර පසටද දරුවන් යොමු වී ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.පුළුල් වැඩ පිළිවෙළක් මේ සඳහා යොදන්නේ නම් හොඳ බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

පාසලේ විදුහල්පතිතුමා,විනයභාරව සිටින ගුරුමණ්ඩලය සමඟත් දරුවන් එකටඑක කියනා තත්ත්වයට පත් වී ඇති බවත්,සීමාව ඉක්මවා ගොස් ඇති බවත්,තර්ජනාත්මකව නොව දරුවන්ට මේවායෙහි ආදීනව ඔවුන්ට පහදා දී ආකල්පමය සංවර්ධනයක් කිරීමට හැකි ඒ පිළිබඳ දැනුවත්කමක් තිබෙන පිටස්තර පාර්ශවය මේ සඳහා සම්බන්ධ කරගෙන මෙය සිදු කරමුයැයිද,එවිට මෙය සාර්ථක කරගැනීමට හැකිවේයැයි තමන් සිතනා බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

වසර 1 ½කට පසුව දරුවන් පාසල් ගිය බවත්,එතෙක් දරුවන් නිවෙස් වල සිටි බවත් පාසල් අධ්‍යාපනයෙන් දරුවන් ඈත් වී කාලයක් සිටි බවත් එම නිසා දුරාචාර කටයුතු වලට දරුවන් යොමු වීම වැඩි වී ඇති බවත්,එබැවින් පාසල් වල විනය ගැටළු බොහෝමයක් සිදු වී ඇති බවත්,එබැවින් උපදේශන සේවාව අත්‍යාවශ්‍ය වී ඇති බවත්,මේ සඳහා හැකි උපරිම සහයෝගය ලබාදෙමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහි වැඩ පිළිවෙල සිදු වන්නේ කෙසේදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටි අතර එය කමිටු මඟින් සිදු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා ආගමික නායකයින්ව යොදා ගන්නා ලෙසත්, දරුවන් දහම් පාසල් යන බවත්,නමුත් මේ වන විට දහම් පාසල් සඳහා සහභාගී වීම අඩු වී ඇති බවත් නිසි වැඩ පිළිවෙළක් මේවා සඳහා නොමැති බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

ආසනයේ සංවර්ධන කමිටු රැස්වීම සඳහා විදුහල්පතිවරුන් හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාද සහභාගී වන බවත් නමුත් එය මෑත කාලයේදී නොපැවැත්වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පල්ලි පන්සල් සඳහා සහභාගී වන පිරිස මේ සඳහා යොමු නොවන බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.මෙයට පල්ලිය පන්සල පාසල යන දෙයින් යහමඟට ගන්නා සේම පුනරුත්තාපන පණත පාර්ලිමේන්තුව තුළින් පැමිණිය යුතු බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 15<br>2022-11-03 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iv. 2022-11-02 පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා අප සංචාරක කලාපයේ තිබෙන සංචාරක හෝටල් වලින් වාර්ෂික ගාස්තුව අය කර ගැනීම පිළිබඳව වර්ථමාන තත්ත්වය විමසා සිටින ලදී. එමෙන්ම මේ සඳහා කමිටුව මඟින් තීරණයක්ද ගත් බවත් ප්‍රකාශ කරන ලදී.

ඩෙංගු ඉතාමත් ඉක්මනින් ව්‍යාප්ත වී යන බවත් ,මදුරුවන් ගෙවතු වල තිබෙන අපිරිසිදුතාවය නිසා බෝ වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඊයේ දිනයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති පරිසර කමිටුවේදී බවත්, ග්‍රාම නිලධාරී,ප්‍රජා පොලීසිය හා සමෘද්ධි බලකාය එකතු වී සෑම ග්‍රාම නිලධාරී වසමකම එකතු වී ශ්‍රමදාන වැඩ සටහනක් සෞඛ්‍ය පරීක්ෂක මහතුන් හා සම්බන්ධ වී සිදු කිරීමට තීන්දුවක් ගත් බවත්, එය හෙට දිනයේ සිට ක්‍රියාත්මක වේයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙම මස 25 වන දින කම්මල වෙරළ පිරිසිදු කිරීමට සාකච්ඡා කල බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, සිරිගම්පල ජනපදයේ එකතු වන දිරන කසල පාර මාර්ගය දෙපස තබා ගිණි තැබීම සිදු කරන බවත් මෙය කමිටුවේද සාකච්ඡා කල බවත්, කොම්පෝස්ට් අංගණයට එන කසළ ද අඩු බව නිලධාරීන් පැවසූ බවත් මේ සඳහා ප්‍රචාරණයක් සිදු කර නීතියක් ගෙනැවිත් මෙම කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

එය සොයා බලන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පරිසර කමිටුව සම්බන්ධයෙන් සාකච්ඡා කල බැවින් තමන් ඉතාමත් වැදගත් කාරණාවක් පැවසීමට යන බවත්, අප ප්‍රදේශයේ තිබෙන පොල් ගස් වලට දරුණු රෝගයක් පැතිර යන බවත්,අප ප්‍රදේශය ගත් විට ලක්ෂ 1 ½ක ජන ගහණයක් සිටින බවත්, අප සභාවේ සංකේතය තුළද පොල් ගස සඳහන් වන බවත් ,කර්මාන්තයන් බොහෝමයක් සිදු කරන බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී. සුදු මැස්සා රෝගය විශාල ලෙස ව්‍යාප්ත වී ඇති බවත්,මෙම ප්‍රාදේශීය සභාව නියෝජනය කල වයඹ පළාත් සභාව නියෝජනය කල මල්රාජ් පීරිස් මැතිතුමා පසුගිය සතියේ වැඩ භාරගත් බවත් එබැවින් එතුමාගෙන් මේ සඳහා සහයෝගය ලබා ගනිමුයැයිද ,අප සියළු දෙනාම මේ සඳහා මැදිහත් වෙමුයැයිද ජනතාවද මේ පිළිබඳව නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

එය ඉතාමත් හොඳ යෝජනාවක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති පරිසර කමිටුවේදී පොල් සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් පැමිණ මේ පිළිබඳව සාකච්ඡා කල බවත්, පැළ පොල් ගස් වලට ගැසීමට අදාල රසායනිකයක් ඔවුන් සූදානම් කර ඇති බවත්,එය ඉසීමට හැකි ප්‍රමාණයක් තිබෙන බවත්, කෙකි වලින් කැඩීමට හැකි පොල් ගස් වලටද එය භාවිතා කරන ලෙසට යෝජනා කල බවත්,නමුත් වැඩියෙන්ම එම රෝගය පැළ පොල් ගස් වලට ව්‍යාප්ත වන බවත් පැළ පොල් වගාවට විශාල හානියක් සිදු වන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.නමුත් මෙම රසායනිකය ගස් වලට ඉසීමට සේවකයින් නොමැති වී ඇති බවත්,කොරොනා ඇඳුම වැනි ඇඳුමක් සභාව මඟින් හෝ මැදිහත් වී සකස් කර දුනහොත් ,රැකියා විරහිත පිරිසක් මේ සඳහා යොමු කල හැකි බවත්,පොල් සංවර්ධන නිළධාරීද අවශ්‍ය සහයෝගය ලබා දෙන බවට පැවසූ බවත් අවශ්‍ය පහසුකම් සභාව මඟින් සිදු කර දෙමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

පොල් ගසකට යන වියදම බලා අදාල හිමිකරුගෙන් එය ලබාගත හැකි බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.උස ගස්වලට Droner මඟින්ද තාක්ෂණය උපයෝගි කරගෙන මෙය සිදු කල හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදි.

එම මැස්සා ගසෙහි යට කොටසෙහි සිටින බවත්, ස්ප්‍රේ මැෂින් එකකින් අඩි 10 ක 12ක ගසකට ගැසිය හැකි බවත්,රබර් හෝස් එකක් හෝ පහළ සිට මැෂින් එකට සවි කර ගැසූ විට එම පීඩනයට එය අඩි 20ක උප ගසකට ගැසිය හැකි බවත්,ඊට්ත් වඩා උස ගසකට මෙම සුදු මැස්සා යැම අඩු බවත්, දලඹුවා ඒවාට යන බවත් එවාට ගසන බෙහෙත් විශ සහිත බැවින් සෘජුවම අතට ලබා නොදෙන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.මෙම සුදු මැස්සාට මාෂල් 20,ඇක්ටාර් වැනි රසායන ද්‍රව්‍යය ගැසිය හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා සමෘද්ධි,ග්‍රාම නිලධාරීන්ගෙන් වාර්තාවක් ගනිමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ නිසා පොල් එලදාව භාගයක්ම අඩු වී ඇති බව ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා රැස්වීමක් කැඳවන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව සභාව මඟින් ගනු ලබන තීරණ වලට අදාලව නීත්‍යානුකුලභාවය හා අණ පණත් වලට අදාල වන ආකාරය පිළිබඳව සභාව දැනුවත් කිරීම ලේකම්වරයාගේ වගකීම බවද එසේ දැනුවත් නොකිරීම නිසා මේ වන විට ලේකම්වරුන්ටද විගණන ගැටළුවක් මතු වී ඇති බවත්, එබැවින් හෝටල් සම්බන්ධයෙන් ගෙන ඇති තීරණය පිළිබඳව සභාව දැනුවත් කිරීම තම යුතුකම බැවින් මෙය පවසන බවත්, හෝටල් වල හිඟ බදු අය

කිරීම සභාවට ඉවත් කල නොහැකි බව ප්‍රකාශ කරන ලදීපසුගිය පරිසර .කමිටුවේදී “පසුගිය වර්ෂ වල හිඟ බදු මුදල් අය කර ගැනීමට නඩු පවරා තිබීම වෙනුවට දැනට ලබා ගත හැකි බදු මුදල පමණක් අයකර ගෙන “ ලෙස සාකච්ඡා කර තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

හිඟ බදු මුදල් අතහැරිය නොහැකි බවත්, මෙය පැහැදිලිව සංශෝධනය විය යුතු බවත්,හෝටල් සම්බන්ධව පොදු පහසුකම් කමිටුවේ සාකච්ඡා කර තීරණ ගත යුතු බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.පණතේ 147,148,149 වගන්ති බලන ලෙසත් පැහැදිලිවම බදු අයකර ගත යුතු ආකාරය එහි සඳහන් වන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.දැනටත් හෝටල් වල හිඟ බදු සම්බන්ධයෙන් උසාවියේ නඩු පවරාඇති බැවින් ගෙවීමට ඇති හිඟ බදු මුදල් අය නොකිරීමට සභාවට තීරණ ගත නොහැකි බවද,එලෙස තීරණ ගතහොත් ඒ පිළිබඳ විගණනයට යොමු වන බවද මේ පිළිබඳව සභාවේ දැනුවත් නොකිරීම පිළිබඳව ලේකම්වරයාටද වගකීමට සිදු වන බවද පෙන්වා දෙන ලදී.

මෙතැනදී තමන් කමිටුව දැනුවත් කලේ එලෙස නොවන බවත්,ඔවුන් නඩුවක් දමා වසර ගණනාවක් යන විට ඔවුන් ව්‍යාපාරය කරගෙන යන ගමන් සභාවේ සේවාවන් ලබා ගන්නා බවත් නමුත් පොඩි මිනිහාගෙන් වරිපම් ලබා ගන්නා බවත් එවිට අසාධාරණයක් සිදු වන බවත්,මත්පැන් බලපත්‍රය අපගෙන් ලබාගෙන සභාවට කිසිඳු මුදලක් ලබානොදෙන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.මෙය කපා හැරීමක් එතැනදී නොපැවසුව බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය සංශෝධනය කරන ලෙස මන්ත්‍රීවරුන්ද ප්‍රකාශ කරන ලදී.

අදාල කාරණය සම්බන්ධයෙන් තමන් කතා කරන බවත්,වාර්තාව අද උදෑසන අතට ලැබුණ බවත්, ඊයේ දින PDF එක ලැබුණ බවත්, අඩුම තරමින් රීති වලට කටයුතු කරන ලෙසවත්, කාරක සභා වාර්තා න්‍යාය පත්‍රය සමඟ එවන ලෙසටත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.මහා සභා වාර්තාව සැකසීම ලේකම් මහතාගේ වගකීම බවත් එබැවින් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීයෙකු ලෙස ,සභාවේ පරිපාලන නිලධාරියා ලෙස වාර්තාව මහා සභාව පැවැත්වෙන දින උදෑසන ලබානොදෙන ලෙසත් ,තමන් ඕනෑ තරම් මීට පෙරද මෙය පෙන්වා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ලේකම් මහතා මෙය පෙන්වා දෙනුයේ ලේකම් මහතාටද ගැටළුවක් පැමිණෙන නිසා බැවින්ද නැතිනම් එයට නිහඬව සිටින බවත් වාර්තා කාල වේලා ඇති ව එවන ලෙසත් එවිට ඒවා කියවා ගැටළු තිබේ නම් විසඳා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 16<br><br>2022-11-02 පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාවේ 5වන පිටුවේ ඉදිරිපත් වූ අදහස් හා යෝජනා අංක 03 සම්පූර්ණයෙන්ම වාර්තාවෙන් ඉවත් කර සංශෝධනයට යටත්ව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

v. 2022-10-28 වන දින පැවති පොදු පහසුකම් කමිටු වාර්තාව මහා සභාවට ඉදිරිපත් කර නොමැති බවත්, මේ මාසයේද කාලය ගත වී ඇති බවත්, එහි වැදගත් කරුණු සාකච්ඡා කර ඇති බවත් එවා එකක්වත් මහා සභාවේ සාකච්ඡා නොවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එය කමිටුවේ ලේකම් විසින් ඉදිරිපත් කර නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**<u>06.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.</u>**

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022 සැප්තැම්බර්**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022 සැප්තැම්බර්**

| |
|---|
| තීරණ අංක 17<br><br>2022 සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය සත්‍ය වාර්තා බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර ගරු මන්ත්‍රී ඒ.එස්.එම් කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022 ඔක්තෝබර් මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.

iv. 2022 වර්ෂයේ ඔක්තෝබර් මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.

## 07. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i). ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව අද නොවැම්බර් 10 වැනි දින අප සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාට ශෝක දිනයක් බවය පත් වූ දිනයක් බව ප්‍රකාශ කරන ලදී. මීට වසර 28කට මත්තෙන් එතුමාගේ ආදරණීය පියාණන් දිවංගත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වයඹ පළාත් සභාවේ ගරු ධීවර අමාත්‍ය ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමන් එදින පැවැත්වූ ජනාධිපතිවරණ මැතිවරණයේදී ඡන්දය ගණන් කිරීමෙන් අනතුරුව පුත්තලමේ දිසාපති කාර්යාලයේ සිට තම නිවහන කරා පැමිණෙන ගමනේදී එතුමාගේ නිජබිම වූ වෙන්නප්පුව මැතිවරණ බල ප්‍රදේශයේදීම රිය අනතුරකට භාජනය වෙමින් එතුමා මුළු ජීවිතයම ජනතාව වෙනුවෙන් පරිත්‍යාග කල බවත් පවසා සිටින ලදී. එතුමා දේශපාලන ජීවිතයේ සුවහසක් පරිත්‍යාග කල පුරවැසියෙකු නීතිඥවරයෙකු ලෙස එතුමාගේ ප්‍රධාන ස්ථානය ලෙස මාරවිල උසාවිය කේන්ද්‍රස්ථානය කරගෙන හලාවත,පුත්තලම, ආණමඩුව,හෙට්ටිපොළ,කුරුණෑගල ද එතුමගේ නඩු විමසන මධ්‍යස්ථාන බවට පත් වී තිබූ බවත්, එතුමා මෙම කාල පරාසය තුළ නීතිඥ ගාස්තුව අවම ලෙස භාවිතා කරපු ඉතාමත් ආදරණීය නීතිඥවරයෙකු බවට ජනතාව අතර පත් වූ බවත්, එතුමාට ඉතාමත් කීර්තියක් ලැබී තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.එතුමාගේ දේශපලාන ජීවිත කාලය තුළ ඉතාමත් කෙටි කලක් වුවත් පුත්තලම් දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංගමයේ ගරු සභාපතිවරයා ලෙසත්, ශ්‍රී ලංකා බුද්ධිමතුන්ගේ සංගමයේ ගරු උපසභාපතිවරයා ලෙසත් පත් වී සිටි බවත්, තමන් එතුමන්ව ඇසුරු කල කාල පරාසය තුළදී ඉතාමත් හොඳින් එතුමා ආයතන සමඟ කටයුතු සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී.පියාණන්ගේ වෘත්තීය තුලම එතුමාගේ පුත්‍රයාණන්ටද නීතිඥ වෘත්තියේ රැදීමට භාග්‍ය ලැබුණාට එතුමා අද අප සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස වැඩ කටයුතු සිදු කලාට එතුමාට ආදරණීය පියාණන්ගේ පිය සෙනෙහස ලැබිය යුතු අවධියේදී එතුමාගේ පියා මෙම සමාජ තලයෙන් අවසන් ගමන් යන්නට සිදු වූ බවත් ප්‍රකාශ කරන ලදී.එතුමාගේ ආදරණීය මෑණියන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් ලෙස විශාල කාර්ය භාරයයක් මෙම වෙන්නප්පුව ආසනයට සිදු කල බවත්, එලෙසම ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන මහතාද අදිකරණය තුළ අප සභාවට ලබා දිය හැකි ශක්තිය ලබාදීමට දැත් දිගු කරන නිහතමානී පුරවැසියෙකු ලෙස තමා පියා ලෙසම කටයුතු කරන බවත් මෙහිදී ප්‍රකාශ කරන ලදී. ඉතාමත් දිගු දේශපාලන ගමනක් ආපු තමන්ගේද නම නාම යෝජනා පත්‍රයට ඇතුලත් කලේ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමා බවත්,එමෙන්ම වෙන්නප්පුව ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයා ලෙස ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමා කටයුතු කල බවත්, මේ සභාවෙන් ද නාම යෝජනා ලබා ගත් බහුතර පිරිසක් එතුමාගේ අත පාරින් පැමිණි පුද්ගලයින් බවත්, එතුමාගේ අවමංගල්‍යය දිනයේදී පුත්තලම් දිස්ත්‍රික්කයේ පමණක් නොව රටේම ජනතාව එතුමාට ආදරය කල බොහෝ පිරිසක් එතැන සිටිනු සියළුම දෙනා දුටු බවත් ප්‍රකාශ කරන ලදී. අද දිනයේදී ගරු මහා සභාවට ශෝක යෝජනාවක් ඉදිරිපත් කරන බවත්,එතුමාගේ පවුලේ සියළු දෙනා වෙනුවෙන් මෙම ශෝක

යෝජනාව ඉදිරිපත් කරනුයේ ගොඩ්ප්‍රි ප්‍රනාන්දු නාමය තවමත් මිනිසුන් අතර මැකී නොමැති බව මතක් කිරීමට බවත්,තවමත් එම ආදරණීය නාමය ජනතාව අතර තිබෙන බවත්,එතුමාගේ ධරමතාවය මත එතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරමින්ද ශෝක යෝජනාවද සභාවට ඉදිරිපත් කරමින් තම කතාව අවසන් කරන ලදී.

| |
|---|
| තීරණ අංක 18<br><br>වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන මහතාගේ පියාණන් වන හිටපු පුත්තලම් දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, වයඹ පලාත් සභාවේ හිටපු ධීවර,සමූපාකාර, පේෂ කර්ම හා සංචාරක අමාත්‍ය, නීතිඥ ගොඩ්ෆ්‍රී ප්‍රනාන්දු මැතිතුමාණන් අභාවප්‍රාප්ත වී 2022-11-10 වන දිනට වසර 28ක් සපිරීම නිමිත්තෙන් එතුමාගේ අභාවය පිලිබඳව ශෝකය ප්‍රකාශ කිරීම 2022-11-10 වන දින පැවති ගරු මහා සභාවේදී සිදු කල අතර එහිදී ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් අදාල යෝජනාව ගෙන ආ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් ස්ථිර කරන ලද අතර ගරු මන්ත්‍රීමණ්ඩලයේ ශෝකයද ප්‍රකාශ කරන ලදී. |

(ii).වෙන්නප්පුව ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය පිළිබඳව කතා කල යුතු බවත්, සෑම විටම වැරදි දේ දුටු බවත් හොඳ දෙයක් පිළිබඳව කතා නොකල බවත්, මේ වන විට සංවර්ධන ක්‍රියාදාමය තුළ ඔක්තෝබර් මාසය වන විට මුළු ආදායම අප විසින් ගෙන ඇති බවත්, පසුගිය දින මොරටුව නගරාධිපතිතුමන්ට ක්‍රීඩාංගණය නඩත්තු නොකර තරඟ සඳහා මුදල් අය කර ගැනීමක් පිළිබඳව ප්‍රවෘත්තියක්ද පල වූ බවත්නමුත් අපි මෙම ක්‍රීඩාංගණය පාසල් සඳහා ඉතාමත් අඩු මුදලකට ලබා දෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ දින වල ගාල්ලේ පැවැත්විමට තිබූ නෙට්බෝල් තරඟාවලිය ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ පවත්වන බව ත්‍රු.18,000ක් වැනි මුදලක් මේ සඳහා අය කරන බවත් එසේ සාදාරණව මුදල් ගෙන ඉෂ්ඨ සිද්ධ කර ඔක්තෝබර් මාසය වන විට 441,000ක මුදලක් වියදම ලෙස දරා ඇති බවත්, මේ සියල්ලම සේවාවන් සිදු කර රු.130,000ක මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.මේ සියල්ල නිසි ලෙස පරිපාලනය කිරීම තුළ අත්කර ගත් බවත් ඉදිරියටද සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කරමුයැයිද,එමෙන්ම ක්‍රීඩා කමිටුවේ ගරු සභාපතිතුමාද මෙහි සිටින බවත් අද වන විට මෙම ක්‍රීඩාංගණය පිළිබඳ මුළු ලංකාවම කතා කරන බවත් ප්‍රකාශ කරන ලදී.මේ දේවල් නිසි ලෙස ඉෂ්ඨ සිද්ධ කිරීමට අවශ්‍ය සහයෝග ලබා දීම පිළිබඳව ක්‍රීඩාංගණ භාරකරු තරංග කොස්තා මහතා ඇතුළු සියළුම කාර්යමණ්ඩලයටද ස්තූතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

(iii).ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා සියළු දෙනාගෙන්ම අවසර ලබා ගැනීමෙන් පසුව දිවංගත ගොඩ්ප්‍රි ප්‍රනාන්දු මැතිතුමා 1994 වර්ෂයේදී අප අතරින් වෙන් වූ බවත් තමන් 1996 වර්ෂයේදී නිතීඥවෘත්තියට පැමිණි බවත් එවැනි කෘතහස්ත නීතීඥවරයෙකු සමඟ නීතිඥ වෘත්තීයේදී කටයුතු කිරීමට නොලැබීම පිළිබදව තමන් දුක් වූ බවත් ප්‍රකාශ කරන ලදී.නීතිඥවරයෙකු වීමට පෙර දේශපාලඥයෙකු වශයෙන් එතුමා සිදු කල කාර්යභාරය තමන් දුටු බවත්,එතුමා සමග පුද්ගලිකව කතා කර තිබෙන බවත්, නමුත් නිතීඥ ජීවිතයේදී එතුමාගෙන ලබා ගැනීමට තිබූ දේ ලබා ගැනීමට නොහැකි වීම නිසා දුක් වන බවත් ප්‍රකාශ කරන ලදී.එතුමාගේ සහෝදරිය වන නීතිඥ ජෙනට් ප්‍රනාන්දු මහත්මියව ඇසුරු කිරීමටද තමන්ට අවස්ථාව ලැබුණ බවත් ඉන් පසුව එතුමාගේ ආදරණීය පුත්‍රයා වන නීතිඥ කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාවද ඇසුරු කිරීමට අවස්ථාව ලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී.දේශපාලන පවුලකින් බිහි වූ චරිතයක් බවත්, නීතිඥවරයෙකු වශයෙන් මෙන්ම දේශපාලන වෘත්තියේදීද නොසැලී කටයුතු කල පුද්ගලයෙකු බවත්, ප්‍රගතිශීලි කණ්ඩායමේ විශාල ගසක් අපට නැති වුනා වැනි හැඟීමක් දැනෙන බවත් ප්‍රකාශ කරන ලදී. උගත්කම හා බුද්ධිමත්කම යන දෙකම තමන් මෙතුමා තුළින් දුටු බවත්,හොඳ නායකයෙකු බවත්,එතුමා වෙන්නප්පුව ආසනය තුළ අද වන විට සිටියා නම් අප මීටත් වඩා ඉහළ ස්ථානයක සිටීමට තිබූ බවත්, අද පාර්ලිමේන්තුව තුළ කැබිනට් අමාත්‍යවරයෙකු නොමැත්තේ මේ නිසායැයිද මන්ද මෙතුමා සිටියා නම් පුත්තලම් දිස්ත්‍රික්කයේ කැබිනට් අමාත්‍යවරයෙකු බව තම හැඟීම බවත් ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව ආසනයට විශාල පාඩුවක් බවත්,එතුමා වසර 52ක් වැනි මැදි වයසේදී අපිට අහිමි වූ බවත් එය පුත්තලම් දිස්ත්‍රික්කයේ ජනතාවට පාඩුවක්, හිඩසක් ලෙස එකල මෙන්ම අදත් තමන් දකිනා බවත් ප්‍රකාශ කරන ලදී.ජනතාව එතුමාව අමතක නොකල බවත් ඉන් පසුව එතුමාගේ ආදරණීය බිරිඳ ශ්‍රීයානි ප්‍රනාන්දු මැතිණියව මන්ත්‍රීවරියක් බවට පත් කල බවත්, අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් කල බවත්, අප සභාවේ ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාව ද අඛණ්ඩව මන්ත්‍රීවරයෙකු

ලෙස ජනතාවගේ ආදරය තුළ අප අතර රඳවා තිබෙන බවත්, එම ජනතාවටද තම කෘතගුණ පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී. දිවංගත ගොඩ්ප්‍රි ප්‍රනාන්දු මැතිතුමාගේ ආභාෂය තුළ එම තනතුර අද තමන් දරණ බවත් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ පුත්තලම් දිස්ත්‍රික් නීතිඥ සංගමයේ සභාපති ධුරය තමන් දරන බවත් ප්‍රකාශ කරන ලදී. කෙසෙ නමුත් දිවංගත ගොඩ්ප්‍රි ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ශෝකය එතුමාගේ ආදරණීය බිරිඳට හා දරුවන්ට ප්‍රකාශ කරන ලෙසටද ඉල්ලමින් ,පියාගේ අඩුව පුරවමින් මාරවිල උසාවිය තුළ දුප්පත් පිරිසට ඉතාමත් සාධාරණ මුදලකට නඩු කතා කරන බවත් නීතිඥවරයෙකු වශයෙන් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාට ස්තුති වන්ත වන බවත් පවසමින් තම කතාව අවසන් කරන ලදී.

(iv).ගරු මන්ත්‍රීනී එච්.එම්.සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව විපක්ෂය නියෝජනය කරමින් ඉතාමත් සුළුවෙන් ගොඩ්ප්‍රි ප්‍රනාන්දු මැතිතුමාගේ ගුණකතයක් කිරීමට අවස්ථා ඉල්ලා සිටින ලදී. තමන් වයස අවුරුදු 5දී එතුමාව දුටු බවත්,එතුමා මියයන මොහොත දක්වාම තමන්ට වයස අවුරුදු 17ක් වන තෙක් පියෙකු ලෙස තමන් දුටු බවත්, එකල එතුමාගේ දේශපාලන ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධයක් නොතිබුණත් අද වන විට සමාජය දෙස බැලීමේදී එතුමාගේ දේශපාලන ජීවිතය පිළිබඳ දැන ගැනීමට බොහෝ දේ ලැබුණ බවත්,ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පැවසූ පරිදි දේශපාලන ක්ෂේත්‍රයේ විශාල හිඩැසක් ඇති වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ගරු පෙස්ටස් පෙරේරා මැතිතුමාව හා ගොඩ්ප්‍රි ප්‍රනාන්දු මැතිතුමාව දේශපාලනයට පැමිණි විට දකින්නට නොලැබුණ බවත්, එම දැවැන්ත වෘක්ෂ දෙකෙහි සෙවණ ලැබීමට අවස්ථාව නොලැබුණද තම වාසනාවට එතුමන්ලා දෙදෙනාගේම පුතුණුවන් දෙදෙනා සමඟ වෘත්තීය හා දේශපාලන ජීවිතය තුළ කටයුතු කිරීමට අවස්ථාව ලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී. වෘත්තීය ජීවිතය තුළද එම වෘත්තීය හොඳින් සිදු කල ඉතාමත් දක්ෂ එමෙන්ම ආදර්ශයට ගත හැකි පුද්ගලයෙකු ලෙස තමන් අසා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එම චරිතය යටතේ වෘත්තීය ජීවිතය ගත කිරීමට වාසනාවක් නොලැබුණ බවත් නමුත් එතුමාව පියෙකු ලෙස දකින්න අවස්ථාව ලැබුණ බවත් එතුමා දෙස බලා ඉගෙන ගෙන තම පෞර්ෂ වර්ධනයට බොහෝ දේ එකතු කර ගත් බවත් මතක් කරන ලදී.අද දින විපක්ෂය නියෝජනය කරමින් ප්‍රාදේශීය සභාවේ එතුමා පිළිබඳ ගුණකථනයක් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වන බවද තමන් කෙදිනකවත් මෙවැනි අවස්ථාවක් ලැබෙයියි නොසිතූ බවත් එතුමා කොහේ හෝ සිට එතුමන්ගේ දරුවන් ලෙසම තමන් දෙසද බලා එම රැකවරණය ලබා දෙනු ඇතැයි පවසමින්ද, එතුමාට මෝක්ෂ සුව ප්‍රාර්ථනා කරමින්ද තම කතාව අවසන් කරන ලදී.

(v). ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව තමන් මන්ත්‍රී ධූරයට පත් වී වසර 5ක් පමණ වන බවත්,සිරිගම්පල ගැන කතා කලහොත් අද දින ඉතාමත් දුකක් ගෙනෙන දිනයක් බවත් මැ/ලුණුවිලට ගෙනා රා තැබෑරුමක් උ/සිරිගම්පලට ගෙන ආ බවත්, මෙය කෙසේ සිදු වූයේද යන්න නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී.සෑම දිනම මත්ද්‍රව්‍යය ගැන කතා කරන බවත්,එම වසමේ ග්‍රාම නිලධාරීතුමියද තමන්ට කතා කල බවත් ප්‍රකාශ කරන ලදී.

එම රා තැබෑරුම ස්ථාපිත කර තිබේදැයි ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

එය ස්ථාපිත කර ඇති බවත්,තමන්ද මේ පිළිබඳ නොදන්නා බවත්,පුද්ගලයෙකු පැමිණ තමන්ට ඒ පිළිබඳ දැනුවත් කරන ලෙස පැවසූ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. එම අවස්ථාවේදී සභාවෙන් තැබෑරුම් වලට බල පත්‍ර නොදෙන බවත්,ප්‍රාදේශීය ලේකම් විරෝධතා කැඳවා එය ලබා දෙන බවත් තමන් පැවසූ බවත්,නීත්‍යානුකූලව ලැබෙන බල පත්‍රයකට අපට බලපෑම් කිරීමට නොහැකි බවත්,බල පත්‍රයක් ගත් බවට තැන තැන පෙන්වූ බවට ආරංචි වූ බවත්,නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් බල පත්‍රයක් නිකුත් කර නොමැති බව පවසා තිබූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.අද දින පාර අයිනෙන් ලොකුවට රා බොමු ලෙස සඳහන් කර තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය ඉතාමත් බැරෑරුම් ගැටළුවක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලුණුවිල රා තැබෑරුම වසර 25කට පමණ පෙර යෝජනා කර ඇති බවත්,එය මෙම ජනපදයට නුසුදුසු යැයි පවසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් බලපත්‍ර නිකුත් කර නොතිබුණ බවත්, විරෝධතාවයක් තිබෙන බැවින් එය ස්ථාපිත නොකල බවත්,මෙය වහාම නතර කර දෙන ලෙසත්,එය ඉතාමත්

අවලස්සන බවත්, නුසුදුසු බවත් ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

තමන් මේ සඳහා සොයා බලා කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(vi).ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමා පිළිබඳ ගුණකථනයක් සිදු කල යුතු බව ප්‍රකාශ කරන ලදී.එතුමා පලාත් පාලන මැතිවරණයේදී තමාව නම් කල බවත්,එතුමා තමන්ට දරුවෙකු හා සමානව ආදරය කල බවත් එතුමා තමන්ව නම් කල විට ගරු සභාපතිතුමාගේ මාමා විසින් තම නම ඉවත් කල බවත් එයත් පැවසිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.එතුමා එම අවස්ථාවේදී නාත්තන්ඩිය ආසනයේ සංවිධායක බවත් දෛවයේ සරදමක් ලෙස ගරු සභාපතිතුමාගේ මාමා විසින්ම තමන්ව නැවතත් දේශපාලනයට ගෙනා බවත් ප්‍රකාශ කරන ලදී.දක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු බවත්,ජනාධිපතිවරණය තරම් ඉහළට යාමට හැකි දක්ශතාවයක් තිබූ පුද්ගලයෙකු බවත්,හොඳ දැක්මක් හොඳ විඥ්ඥානයක් තිබෙන නායකයෙකු බවත් ප්‍රකාශ කරන ලදී. එතුමාගේ අභාශය තුළ අද දේශපාලනය කරන බවත්,මැතිවරණ ප්‍රතිඵල පැමිණීමට පෙර දින තම නිවසට එතුමා පැමිණි බවත්, ඉන්ධන වාහනයෙන් කාන්දු වී තිබූ බවත්, රියදුරාද අසීමිත ලෙස වේගයෙන් තම නිවසේ සිට ගිය බැවින් තමන් එතුමාට දුරකථන ඇමතුමක් ලබා දී ඒ පිළිබඳ පැවසූ බවත් නමුත් එතුමා තම රියදුරා ඉතාමත් දක්ෂ රියදුරෙකු බව පැවසූ බවත් එවැනි මතකයන් තම මතකයේ රැඳී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.එතුමා විසින් වපුරපු බීජයක් ලෙස එතුමාට ස්වර්ග සම්පත්තිය ප්‍රාර්ථනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

(vii).ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව තම පියා මියගොස් වසර 28ක් ගතවන දිනයේදී ප්‍රා දේශීය සභාවේ මහා සභා රැස්වීමට සහභාගී වීමට තමන්ට සිදු වී ඇති බවත්, ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ශෝක යෝජනාවක් ගෙන ආ බවත්,ගරු මන්ත්‍රීවරුන් විසින් ශෝකය ප්‍රකාශ කල බවත් සියළුම දෙනාට ස්තුතිය පළ කර සිටින බවත් ප්‍රකාශ කරන ලදී. තම පියා සම්බන්ධයෙන් කිවීමට බොහෝ දේ තිබෙන බවත් නමුත් කාල වේලා ගත වී ඇති මෙම මොහොතේදී ඒ සඳහා කාලය මිඩංගු නොකරන බවත් ප්‍රකාශ කරන ලදී.තම පියා අවාසනාවන්ත ලෙස මිය නොගියේ නම් මෙම ප්‍රදේශයේ භෞතික,සමාජීය ආර්ථික දියුණුවක් ලබා ගැනීමට තිබූ අවස්ථාවක් ගිලිහී ගිය බවත් ප්‍රකාශ කරන ලදී.එකල දේශපාලනය අදට වඩා බොහෝ වෙනස් බවත්,යම් වචනයක් කිවුවහොත් එය එලෙසම පැවති බවත්,මිල මුදලට යටවූ දේශපාලන වාතාවරණයක් නොතිබුණ බවත් පෙස්ටස් පෙරේරා ඇමතිතුමාගෙන් පසුව පුත්තලම් දිස්ත්‍රික්කයට බිහි වීමට තිබූ විශාල නායකත්වයක් අපට අහිමි වී ගිය බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මෙම අවස්ථාවේ මෙම සභාවට ශෝක යෝජනාවක් ගෙන ඒම සමබන්ධයෙන් හා ඒ පිළිබඳව සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් තම කතාව අවසන් කරන ලදී.

(viii).න්‍යාය පත්‍රයට අදාල නොවන මැදිකැලේ ඉඩමට අයත් ලිපි කීපයක් තිබෙන බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

සභාගත කරන ලෙස පැවසූ ලිපි සභාගත කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ඉඩම් කට්ටි කිරීම සම්බන්ධයෙන් සඳහන් වී ඇති බවත්,ඒ පිළිබඳව විමසා සිටින ලදී.

ඉඩම් කට්ටිකරු සමඟ සාකච්ඡා කල බවත්,එතැනදී එකඟතාවයකට පැමිණීමට නොහැකි වූ බවත්,වාර්තාවක්ද සූදානම් කරඇති බවත්, තව සතියක කාලයක් නැවත කොමසාරිස්තුමා සමඟ කතා කිරීමට ඉල්ලූ බවත් සතියක් තුල එය සිදු කර දෙන වට පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මැදිකැලේ ප්‍රශ්නය දැන් මතුවූ බවත්,ගිවිසුම් පත්‍රය එවා ඇති බවත්,එම ගිවිසුම් පත්‍රය අත්සන් කල පසුව ඔවුන්ට ස්ථිර ගොඩනැඟිලි ඉදි කිරීමට හැකි දැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

එසේ කිරීමට නොහැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තාප්පය ඉදි කර ඇති බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එය ඉදි කර තිබූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාර්ග ගැසට් කිරීමේදී එය නම් කර තිබේ නම් ගැටළුව විසඳා මාර්ගය සඳහන් කරන ලෙස ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.එය විශාල ගැටළුවක් බවත්, පල්ලියේ තාප්පය කැඩූ බවත්,මෙම තාප්පය පමණක් ඉතිරි කර ඇති බවත් කොටස අල්ලාගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එය ඉවත් කරන ලෙසට තමන්ද යෝජනා කරන ලෙසත් තවදුරටත් ප්‍රකාශ කරන ලදි.

ඉදි කල පසුව සභාව මඟින් බදු ලබා දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සුළු මුදලකට බදු ලබා දුන්නේයැයි පැවසීම විහිලුවක් බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

එහි මුදලක් සඳහන් වී නොමැති බවත්, ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක නීත්‍යානුකූව තාප්පයක් ඉදි කරන්නේ කෙසේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

මයෙ තේරුම් ගන්නා ලෙසත්,මොවුන් නොදැන තාප්පය ඉදි කර ඇති බවත්,පසුව ඉඩම් මිනින්දෝරුවන් ගෙනැවිත් පිඹුරුපත සැකසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මැනුම් කටයුතු අවසන් වූ පසුව මෙය බදු ලබාදෙන ලෙස ඒකමතිකව තීන්දු කල බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදි.

මන්ත්‍රීවරුන්ගේ බලවත් ඉල්ලීම මත බදු ලබා දීමට ගිය බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉල්ලීමක් සිදු කලේ බදුදීමට බවත්,තාප්ප බඳින ලෙස නොපැවසූ බවත්,එය ඉවත් කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදි.

තාප්පය ඉවත් කරන ලෙස ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ද ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා මෙහිදී ප්‍රකාශ කර සිටියේ ඉඩම් කොටස් කරන පුද්ගලයෙකු විසින් එය කොටස් කර පාරට කොටසක්ද වෙන් කර තිබූ බවයි.මෑත කාලයේදී එම කොටස සභාවට ලියූ පසුව එම ඉඩමට අනුමැතිය සැලසුම් කමිටුව මඟින් ලබාදෙන බවත්,නමුත් මේ අවධියේදී ගරු ට්‍රෙවින් ප්‍රනාන්දු මැතිතුමා ගරු සභාපතිවරයා වී සිට ඇති බවත් එකල මෙම පවසන ඉඩමට මාර්ගයන් හෝ පොදු කොටසක් පවරා දීමක් සිදු වී නොමැති බවත් එම ඉඩම් වල සිටින උදවියට වෙන් කල කොටස පෙන්වා දී හො නැතිව කෙසේ හෝ භුක්ති විඳිමින් සිටි බවත්,යම් උදවිය මාර්ගයට කොටසක් තබා තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.මෙම ගැටළුව ඇති වූ අවස්ථාවේදී කණ්ඩායම් දෙකක් සැදුන බවත් එක් කණ්ඩායමක් අනෙක් කණ්ඩායමට විරුද්ධව වැඩ කටයුතු කරමින් මෙම ඉඩම් භුක්ති විඳන පිරිසගෙන් ඉඩම් කොටස ලබා ගැනීමේ වැඩපිළිවෙලක් සංවිධානාත්මකව සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී.මෙම අවස්ථාවේදී අප සම්බන්ධ වී නොසිටි බවත්, ඉඩම් ඉදිරියෙන් සභාවට අයත් මාර්ගයක් තිබෙන බවත්,ඉඩම් කොටස් කල පසුව සභාවට වෙන් වූ කොටසක් ලැබෙන බවත් එය සභාවට පවරා දී නොමැති බවත් නමුත් සභාවේ නීතිරීති අනුව එම කොටස අපට අයිති වන තත්ත්වයක තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.මෙවැනි වාතාවරණය තුළ ගරු සභාපතිතුමාට මේ සඳහා මැදිහත් වීමට සිදු වූ බවත්,කාලාන්තරයක සිට ඔවුන් කම්බි වැට වල් ගසා භුක්ති විඳිමින් සිටි බවත්, ප්‍රා දේශීය සභාව සතු දේපළක් නම් අපේ දේපල කිසිවෙකු අයිති කර ගැනීමට නොහැකි බවත් නමුත් මෙය වෙනත් ආයතනයක් විසින් පාරට ඉඩ ඉතිරි කර අතහැර දමා ගිය දේපලක් බවත් මෙතැනදී ලංකාවේ නීති රීති අනුව වසර 10කට වඩා පුද්ගලයෙකු භුක්ති වින්දොත් අනෙක් පුද්ගලයාට එය අයිතිකර ගැනීම සඳහා නඩු පැවරීම අහිමි වන බවත් ප්‍රකාශ කරන ලදී.මාර්ගය සඳහා තිබෙනුයේ සභාවට වෙන් කල කොටසදැයි යන්න ගැටළුවක් තිබෙන බවත්,කෙසේ නමුත් මෙම පාර්ශවයන් ගරු සභාපතිතුමා සමඟ ගිවිසුමකට පැමිණ ඇති බවත් මෙය අධිකරණයක් දක්වා නොයවා යම් යම් සමථයන් හරහා අදාල ඉඩම් ප්‍රමාණයන් ලබා ගැනීම සුදුසු බවත්,නීතිමය මාර්ගයට යාමට සිදු වුවහොත් මෙම වෙන් කර තිබෙන ඉඩම් ප්‍රමාණය කෙලෙස අයිතිවේදැයි පැවසීම අධිකරණය තීරණය කරාවියැයිද ප්‍රකාශ කරන ලදී. එබැවින් කිසිවෙකුගේ හිත් රිදවීමක් හිරිහැරයක් නොකර අපේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්,එක එකකෙනාගේ ඕනෑ එපාකම් ක්‍රියාත්මක කිරීමට ගොස් අප සභාව අමාරුවේ වැටී ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙම ගිවිසුම නිවැරදිව කියවා බැලූවේදැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය කියවූ බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය ප්‍රාදේශීය සභාවට අයිති නොමැති බව කිසිවෙකුට පැවසීමට නොහැකි බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. ඉඩම් කොටස් කල පසුව හිටපු ගරු සභාපති ට්‍රෙවින් ප්‍රනාන්දු මහතා කට්ටි සැලැස්ම අනුමත කර ඇති බවත්,මෙය බදු දීමට නම් ස්ථිර ගොඩනැඟිලි ඉදි කිරීමට හැකිදැයිද විමසා සිටින ලදී.

සභාවේ ඉදි කිරීමක් සේ සලකා තක්සේරු වටිනාකම වැඩිපුර දමා එය බදු ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම පුද්ගලයා සභාවට අයත් කොටසක් ලෙස පිළිගන්නා බවත්, පාර පළල් කරන විට ඕනෑම අවස්ථාවක එය ලබා දීමට එකඟ බවට එම පුද්ගලයා ගිවිසුම් අත්සන් කර ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.දැනට ඒ සඳහා වුවමනාවක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

මෙය හිතාමතාම වසා දමන බවත්,පල්ලියේ තාප්පය කඩා දමා ඇති බවත් ජනතාවට ඇහුම්කම් දිය යුතු බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා පැවසූ ලෙස එම පිරිස දෙකට බෙදී ඇති බවත් තාප්පය කඩා ගැනීමට අවශ්‍ය බැවින් පල්ලියේ තාප්පයේ බලෙන් කැඩූ බවත් ප්‍රකාශ කරන ලදී.

එය බලෙන් නොකැඩූ බවත්,පියතුමා එකඟ වූ බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

මෙම සභාවේ එකඟතාවයෙන් ගිවිසුම අත්සන් කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම සිදු කර තිබෙන වැඩ කටයුත්ත වැරදි බව ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

එම කොට්ඨාසයේ මන්ත්‍රීවරයා සිටින බවත්,සභාවේ එකඟතාවයෙන් මෙය බදු ලබ දී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

මෙය අප සභාවට වාසිදායක බවත්, ගරු සභාපතිතුමා ගිවිසුම්ගත වී ඇති බවත්,මෙතැන තිබෙනුයේ බදු ගිවිසුමක් නොව ගිවිසුමකට එළඹී ඇති බවත් තවදුරටත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

2019- 04- 11 වන දින පැවති මහා සභා රැස්වීමේදී මෙම ප්‍රශ්නය මතු වී ඇති බවත් " මැදි කැලේ අනවසර තාප්පය සම්බන්ධව ගත් පියවර හා එය ඉවත් කිරීමට ලිපි හෝ නඩු මගට ගියේද යන්න පිලිබඳව ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා විසින් ප්‍රශ්නය ඉදිරිපත් කරන ලදී." ලෙස සඳහන් වන බවත්, එහිදී එයට පිළිතුරු ලෙස "මැදිකැලේ ග්‍රාමයේ ඩබ්.පී.විල්සන් මහතා විසින් අනවසරයෙන් තාප්පයක් ඉදි කරමින් සිටින බවට ලද පැමිණිල්ලක් අනුව පරීක්ෂා කර බලා එම ඉදි කිරිම අත්හිටුවා ඇත.ඊට අදාල නිතීමය පියවර ගැනීම සඳහා අනවසර ඉදි කිරිමට අදාල ස්ථානය මිනින්දෝරු මහතෙකු මඟින් මැණුම් කිරිමෙන් පසුව ඊට අදාල ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතව ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී." ලෙස සඳහන් වී ඇති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.2020දී ගිවිසුම අත්සන් කර ඇති බවත්,සභාවේ අවසරයක් නොමැතිව තාප්පය ඉදි කලේ කෙලෙසදැයිද විමසා සිටින ලදී.

තාප්පය නොදැන ඉදි කර තිබූ බවත්, පසුව මිනින්දෝරු වාර්තාව පැමිණි පසුව එය දන්නා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නමුත් එය ඔවුන්ගේ නොවන බවට ඔවුන් දන්නා බව ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය ප්‍රාදේශීය සභාවට අයත් බවත්,ප්‍රාදේශීය සභාවේ පරිපාලනයේ දුර්වලතාවයක් තිබෙන බවත්,හිටපු සභාපතිතුමා එම ඉඩම් කට්ටි වලට අත්සන් කර ඇති බවත්,සභාවට අයත් කොටස පාරට ලබා දී ඇති බවත් මෙය සභාවට අයත් කොටස ලෙස කාටත් තේරෙන බවත්,නමුත් ඔප්පුවක් මාර්ගයෙන් එය ලබාගෙන නොමැති බවත් තවදුරටත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.මෙය වැරැද්දක් බවත්,එය පටු පාරක් බවත්, නිවෙස් තිබෙන බවත් ,පල්ලියක් තිබෙන බවත් දේවස්ථානයේ පල්ලියේ මංගල්‍යය අවස්ථාවේදීද ඉතාමත් අපහසුතා තිබෙන බවට පෙත්සමක්ද ඉදිරිපත් කර තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.ගිවිසුමක් තිබෙන බවත්,නමුත් ස්ථිර ගොඩනැගිල්ලක් ඉදි කිරීමට පණතේ තිබෙන්නේදැයිද තාප්පය යනු ස්ථිර ඉදිකිරීමක් බවත් ප්‍රකාශ කරන ලදී.

ගිවිසුම මහා සභාවට ඉදිරිපත් කර මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ගිවිසුම්ගත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව අද දින කතා කරනුයේ 2019 සිට පැමිණි ගැටළුවක් බවයැයි ද,එමෙන්ම මෙම සභාපතිතුමාට පෙර මෙම ඉඩම කට්ටි කර ඇති බවත්, එකලද මහා සභාව තිබුනද ඉඩම් කට්ටි කිරීමේදී විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.පැමිණි ගැටළුවත් සමඟ මෙය විධිමත් කිරීමට මැදිහත් වීමට ගරු සභාපතිතුමාට සිදු වූ බවත්, 2019 වර්ෂයේදී තමන් පැමිණීමේදීද මෙම ගැටළුව මතු වී තිබූ බවත් තමන් හා විෂය නිලධාරී ගොස් කුලියාපිටිය මිනින්දෝරු මහතාගේ නිවසට ගොස් ඔප්පු තිරප්පු ගෙනැවිත් සකස් කල බවත්,මේ සඳහා ගරු මන්ත්‍රී ඩබ්.ශිරොන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා සහය වූ බවත් ,අවසානයේ ගිවිසුම් ගත වීමට පෙර මේ සඳහා ගත් තීන්දුව පිළිබඳ අසා මේ පිළිබඳ කතා කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. 2020-09-10 දින සභා වාර්තාවේ තීරණ අංක 19 යටතේ "මැදි කැලේ තාප්පය ඉවත් කිරීම හා භූමිය අත්පත්කරගැනීමේ ගැටළුවේදී ඉදිරි සංවර්ධන කටයුත්තකදී අත්පත් කරගෙන මාර්ගය පුළුල් කරගන්නා තෙක් පවතින භුක්තිය ඒ ආකාරයෙන්ම ගිවිසුමකට යටත්ව ජනතාවට ලබා දෙමුයැයි ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ .නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ එකමතික අනුමැතිය ලබා දෙන ලදී." ලෙස සඳහන් වන බවත්,මේ තීරණය නිසා මෙලෙස කටයුතු කර ඇති බවත්,මහා සභාව මඟින් තීන්දුව ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මෙ සඳහා මාර්ගය පළල් කිරීමට අදාල යෝජනාවක් කොට්ඨාස මන්ත්‍රීවරයා විසින් ගෙනෙන ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සියල්ලම තමා සතු ව තිබෙන බවත්,මෙතැනදි ගැටළුව තිබෙනුයේ ගිවිසුම අත්සන් කර ඇති බවත්, ප්‍රාදේශීය සභාවට අයත් භූමියක ස්ථිර ගොඩනැගිල්ලක් සෑදීමට හැකිදැයි යන්න බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

තාප්පය සාදා අවසන් කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

2019දී අනවසර ඉදි කිරීමක් කරන බවට නිලධාරී වාර්තාවක්ද ලබා දී ඇති බවත්,එවිට සභාව දැනගෙන සිට ඇති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එම අවස්ථාවේදී තාප්පය ඉදි කර තිබූ බවත්,තවත් කොටසක් ඉදි කරන බවට පැමිණිල්ලක් පැමිණි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ සඳහා යෝජනාවක් ඊළඟ සභාවට ගෙන එන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

(ix). ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා ගරු සභාපතිතුමාගේ අවසර ගැනීමෙන් පසුව ගල්වක මාර්ගයේ තැලවිල්ලකට තාර නොදා ඉතිරි කල කොටසක් තිබෙන බවත්, බොහෝ කලක් ගත වී ඇති බවත් මේ වන විට එය සෝදා පාළුවට ලක් වී ඇති බවත්, එතැනට බොරළු යොදා හෝ සුදුසු කටයුත්තක් සිදු කර දෙනට ලෙසට ඉල්ලා සිටින ලදී.

මේ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසට කොට්ඨාස භාර ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතාට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එය යෝගියානේ සිට කටාන මංකඩට යන පළාත් සභා පාරේ තිබෙන බවත්, එය සංවර්ධනය කරන විට පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මෙම කොටස අතහැර ඉදි කර ඇති බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.මෙය කෙසේ හො සාදමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

(x).ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ප්‍රාදේශීය සභාවට චෝදනාවක් තිබෙන බවත්,විදුලි අංශය මගින් light set ගලවාගෙන යන බවට චෝදනාවක් තිබෙන බවත්,සභාව මගින් විදුලි බල්බ සාදා දෙන බවත්,මෙම කටයුතු සභාව මගින්ද විදුලි බල මණ්ඩලය මගින්ද සිදු කරන්නේ යන්න තවමත් ගම් වැසියන් නොදන්නා බවත්, සභාව මගින් ගලවා ගෙන යන බවට චෝදනාව පැමිණි පසුව තමන්ද එය නිවැරදි කල බවත් ප්‍රකාශ කරන ලදී.විදුලි බල මණ්ඩලයේ පැමිණෙන කාර්මිකයින් විසින් ඒවා ගලවාගෙන යන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ගොනාවිල එබ අසල සිට ගොඩැල්ල පල්ලිය අසලට යන අතරතුර කොටසේ විදුලි දිගුවේ කෙලවර විදුලි කම්බිය නොමැති බැවින් පියතුමාගේද ඉල්ලීමට අනුව  තම නිවසේ තිබූ වයර් කොටසක් සවි කර දී තිබූ බවත් එයත් ගලවා ගෙන ගොස් ඇති බවත් මෙවැනි කටයුතු හෙළා දකින බවත් ප්‍රකාශ කරන ලදී.

විදුලි බල මණ්ඩලයෙන් සර්විස් වයර් සඳහා විදුලි පහන් දැමීමට තහනම් බවත්, දිවා කාලයේ විදුලි පහන් පත්තු වන්නේ නම් විදුලි බල මණ්ඩලයෙන් එම වයර් කපා දමා යන බවත් නැවතත් සභාව මගින් ඒවා සවිකරදෙන බවත් දහවල් කාලයේදීද ඒවා නැවත පත්තු වන බවත්,එවිට විදුලි බල මණ්ඩලය විසින් එම සම්පූර්ණ සෙට් එකම ගලවාගෙන ගොස් ඔවුන් සතුව තබා ගන්නා බවත්,නමුත් එය සභාවට අයත් දේපලක් බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.මන්ත්‍රීතුමා පවසන දෙය සත්‍ය බවත් මේ පිළිබඳව ලිඛිතව දැනුවත් කරන ලෙසත් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

විදුලි පහන් දමන පුද්ගලයා එය නිවීමට දැන ගත යුතු බවත්, මෙය ජනතාව දැන ගත යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගෙවල් වලට එන කණු වයරය විද සෙට් සවි කිරීමට තහනම් බව පවසන බවත්,නමුත් ලුණුවිල පෙස්ටස් මාවතෙන් හැරී යන විට ප්‍රධාන පෙලේ හෝටලයක් තිබෙන බවත්,එම වත්ත ඇතුළත සම්පූර්ණයෙන්ම ගැල්වනයිස් බටයෙන් තනි වයර් එකක් දමා බවත්,සෑම කණුවකටම විදුලි බල්බයක් දමා ඇති බවත්,විදුලි බල මණ්ඩලයේ පුද්ගලයින් එහි ගොස් කෑම කන බවත්,අහිංසක මිනිසුන්ට විරුද්ධ වන බවත් ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව නෙට්බෝල් තරඟාවලිය ආරම්භ වන බවත්,පිටින පැමිණෙන දරුවන්ට නවාතැන් ලබා ගැනීමේ අපහසුතාවයක් තිබෙන බවත් ඒ සඳහා සභාවේ ලියාපදිංචි තානායම් වැනි දෑ වල දුරකථන අංක ක්‍රීඩාංගණය තුළ ප්‍රදර්ශනය කිරීමට හැකිනම් හොදයැයිද ප්‍රකාශ කරන ලදී.

එ්වා ලබා දී ඇති බවත්, නැවතත් සොයා බලා කටයුතු කරමුයැයිද,මෙවැනි දේකට මුහුණ දුන් පළමු වතාව මෙය බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය සභාවට ආඩම්බරයක් බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ලුණුවිල අහස්දියවල පාරට යන මාර්ගයේ ගැටළුව පක්ෂ විපක්ෂ තොරතුරු ගෙන විසඳා දෙන ලෙසත්,පක්ෂව වැඩි පිරිසක් සිටී නම් එම මාර්ගයට නම දමා දෙන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගොඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

එය සිදු කල යුතු වැඩ කටයුත්තක් බවත්,මෙම මාර්ගය කිංස්ලි මහතා මහන්සි වී අත්පත් කර ගත් බවත් ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

කොට්ඨාසභාර මන්ත්‍රීවරයාට මෙය පවසා විසඳා ගනිමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තූතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

2022/12/08 - තීරණ අංක 01

2022-11-10 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**කේ.වී.සුසන්ත පෙරේරා,**
**සභාපති,**
**ප්‍රාදේශීය සභාව වෙන්නප්පුව.**